# විදේශ රැකියා අමාත්‍යාංශය

# වාර්ෂික කාර්ය සාධනය - 2015

**(2015.01.01 – 2015.12.31)**

**විදේශ රැකියා අමාත්‍යාංශය**
**5 වන කුළුණ, 12 වන මහල, මහබැංකු ගොඩනැගිල්ල,**
**අංක 30, ජනාධිපති මාවත,**
**කොළඹ 01.**



## ගරු ඇමතිතුමියගේ පණිවුඩය

2015 වසර සඳහා මාගේ අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ඉමහත් ගෞරවයකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සහ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ මගපෙන්වීම යටතේ යහපාලනය පිළිබඳ නව රජයේ දැක්ම ශ්‍රම විගමනයේ සියලු අංශයන්හි පිළිබිඹු කිරීමට විදේශ රැකියා අමාත්‍යාංශය නව මූලාරම්භයන් ගෙන තිබේ. ඒ අනුව, මාගේ අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති ආයතන සියල්ල සුරක්ෂිත විගමනය සහ ශ්‍රී ලාංකික විගාමික සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම යථාර්තයක් බවට පත්කිරීමේ පොදු අරමුණ සහ දැක්ම බෙදා හදා ගනියි.

අප සියලු දෙනාම දන්නා පරිදි විගමනය, ගෝලීයකරණය වූ ලෝකයෙහි වැදගත් සංසිද්ධියක් බවට පත්ව තිබේ. නිසි පරිදි කළමනාකරණය කරනු ලැබුවහොත් විගමනය රටටත් විගාමික සේවකයන්ට සහ ඔවුන්ගේ පවුල්වලටත් පොදුවේ මුළු මහත් සමාජයටත් ප්‍රතිලාභ ලබාදෙනු ඇත. එසේම එය අප රටේ සංවර්ධන ඉලක්ක සපුරාගැනීමට ද සෘජුව සහ වක්‍රව දායක වනු ඇත.

ශ්‍රී ලංකාවේ ශ්‍රම විගමනය පාලනය කරනු ලබන්නේ ශ්‍රම විගමනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින් වන අතර එමගින් වැදගත් ක්ෂේත්‍ර තුනක් එනම් විගමනය පාලනය සහ නියාමනය, විගාමික සේවකයන් ආරක්ෂා කිරීම සහ සවිබල ගැන්වීම සහ විගමනය හා සංවර්ධනය සම්බන්ධ කිරීම හඳුනා ගනියි.

ඒ අනුව, ප්‍රධාන පාර්ශවකරුවන් සමග සහයෝගිත්වයෙන් යුතුව එම ප්‍රතිපත්තියේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට 2015 වසර තුළදී විදේශ රැකියා අමාත්‍යාංශය ව්‍යාපෘති, වැඩසටහන් සහ ක්‍රියාකාරකම් ගණනාවක් ක්‍රියාවට නංවා තිබේ.

මෙරට විගමනික අංශයේ ඇති එක් ප්‍රධාන අඩුපාඩුවක් ලෙස තොරතුරු කළමනාකරණයේ අප්‍රමාණවත් බව හඳුනා ගනිමින්, පවත්නා ප්‍රාදේශීය මට්ටමේ පරිපාලන ව්‍යූහයේ සේවය කරන්නාවූ විගාමික සංවර්ධන නිලධාරීන් හරහා විගාමික සේවකයන් සහ ඔවුන්ගේ පවුල් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමට සහ වාර්තා තබා ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙලක් ආරම්භ කොට ඇති අතර මෙම ක්‍රියාදාමය විධිමත් කිරීම සඳහා මධ්‍යම අධීක්ෂණ සහ ඇගැයීම් ඒකකයක් අමාත්‍යාංශය පරිශ්‍රය තුල ස්ථාපිත කර තිබේ.

2015 දි අමාත්‍යාංශය, විගාමික සේවකයන් ආපසු පැමිණීම සහ යළි සමාජගත කිරීම පිළිබඳව සමාජ, ආර්ථික සහ මනෝවිද්‍යාත්මක අංශ ආවරණය කරන්නාවූ සාකල්‍යය ප්‍රවේශයක් සහිත ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම මගින් වැදගත් ක්ෂේත්‍ර කෙරෙහි විශේෂයෙන්ම විගාමික සේවකයන් ආපසු පැමිණීම සහ යළි සමාජගත කිරීම පිළිබඳව සිය අවධානය යොමුකර තිබේ.

ආපසු පැමිණෙන විගාමික සේවකයන්ගේ කුසලතා පිළිගැනීමේ අවශ්‍යතාවසහ කුසලතා සහතිකකරණය ප්‍රමුඛතා ක්ෂේත්‍රයක් ලෙස අමාත්‍යාංශය හඳුනාගෙන ඇති අතර කුසලතා අන්‍යෝන්‍ය පිළිගැනීම පිළිබඳ නියාමන වැඩසටහන් ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ගමනාන්ත රටවල් සමග සාකච්ඡා ආරම්භ කර තිබේ.

ජාතික නීති සහ ප්‍රතිපත්ති තුළට ජාත්‍යන්තර ප්‍රඥප්ති සහ සම්මතයන්ගේ නිර්දේශ අන්තර්ගත කරනු ලබන්නේ නම්, සංවර්ධන ප්‍රතිඵල වඩා පුළුල්ව, සාධාරණව සහ සියලු දෙනා ඇතුළත් වන ආකාරයෙන් සපුරා ගැනීමට හැකිවනු ඇත. ශ්‍රම විගමනය පිළිබඳ ශ්‍රී ලංකාවේ පවත්නා වත්මන් නීති ශ්‍රම විගමනය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රතිපත්ති හා අනුකූලවන සේ ප්‍රතිශෝධනය කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින්, සියලු ප්‍රධාන පාර්ශවකරුවන්ගේ අදහස් විමසා ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශ පණත සමාලෝචනය කිරීමට අමාත්‍යාංශය පියවර ගෙන තිබෙන අතර මේ වන විට එම කටයුතු සිදුවෙමින් පවතී.

මිලියන ගණනාවක ජනතාවට තව දුරටත් තම රටවල රැකියා සොයාගැනීමට නොහැකි බැවින් සහ ගමනාන්ත රටවල ශ්‍රම හිඟය ඉහළ යමින් පවතින බැවින් ශ්‍රම සැපයුම සහ ඉල්ලුම වඩාත් ජාත්‍යන්තරකරණය වෙමින් පවතී. ශ්‍රම විගාමිකයන් සඳහා ඔවුන්ගේ කුසලතාවන්ට ගැළපෙන රැකියා සොයා ගැනීම සහතික කරන්නාවූ ප්‍රශස්ත ශ්‍රම වෙළඳ පොළ අවශ්‍යතා ඇගයීමක් අප රටෙහි නොමැති අතර ඒ හේතු කොට ගෙන විගමනික සේවකයන් විශාල පිරිසක් පහළ මට්ටමේ රැකියාවන්හි නිරතව සිටී. මෙම ගැටළුවලට පිළියම් සොයා ගැනීම පිණිස ශ්‍රම වෙළඳ පොළෙහි සමස්ත තත්ත්වය පිළිබිඹු කරන්නා වූ අවශ්‍යතා ඇගයුමකට සහාය ලබා ගනු පිණිස ජාත්‍යන්තර සංවිධානවල තාක්ෂණික සහයෝගය ලබාගැනීමට අප අමාත්‍යාංශය පියවර ගෙන තිබේ.

ශ්‍රම විගමනයේ පොදු අභියෝග හඳුනා ගැනීම පිණිස බහු පාර්ශවකාර සහභාගිත්වය, අන්තර්කරණ ප්‍රතිපත්ති සංවාදය සහ ප්‍රභව සහ ගමනාන්ත රටවල් අතර සම්බන්ධීකරණය මගින් එවැනි අභියෝගවලට පිළියම් යෙදීමේ අවශ්‍යතාවය පවතී.

කොළඹ ක්‍රියාදාමයේ වත්මන් සභාපති වශයෙන්, ශ්‍රම විගමනය කිරීමේදී මුහුණ පෑමට සිදුවන ප්‍රධාන අභියෝග පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා එහි ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ තෙවැනි රැස්වීම මෙම වසරේ නොවැම්බර් 4 සහ 5 දෙදින කොළඹදී පැවැත්වූ අතර කොළඹ ක්‍රියාදාමය, අබුඩාබි සංවාදය සහ අනෙකුත් කලාපීය උපදේශන ක්‍රියාදාම අතර සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමේදී සාමාජික රටවල අභිලාෂයන් පිළිබඳවද අවධාරණය කරන ලදී.

මෙරටෙහි කවර හෝ ප්‍රතිපත්ති හෝ වැඩසටහන් ක්‍රියාවට නැංවීමේදී සාර්ථකත්වය සඳහා දායකවූ සාධකයක් ලෙස මම දැඩිව විශ්වාස කරනුයේ ශ්‍රම විගමනයට අදාළ වැදගත් පාර්ශවකරුවන්ගේ කැපවීම සහ ඔවුන් අතර පැවති අඛණ්ඩ සංවාදයයි.

එබැවින්, දැඩි කැපවීමෙන් යුතුව කටයුතු කරන අමාත්‍යාංශයේ ලේකම් සහ සියලු නිලධාරීන්ටත්, ශ්‍රීලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි සහ ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සියෙහි සභාපතිවරුන් සහ කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තූතිය පිරි නැමීමට මෙය අවස්ථාවක් කර ගන්නා අතර, අමාත්‍යාංශයේ ඉලක්ක සහ ශ්‍රී ලංකා විගාමික සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ විගමනය සුරක්ෂිත කිරීම පිණිස ශ්‍රී ලංකා රජයේ දැක්ම සාක්ෂාත් කරගැනීමේදී සහය දැක්වූ සියලු ප්‍රධාන පාර්ශවයන්ට මම ස්තූතිවන්ත වන්නෙමි.

***තලතා අතුකෝරල (පා.ම.)***
***විදේශ රැකියා අමාත්‍ය***



## ලේකම්තුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකා ආර්ථිකයේ විදේශ විනිමය උපදවන විශාලතම ප්‍රභවය විදේශ රැකියා ක්ෂේත්‍රය වේ. විගමණික ශ්‍රමික ප්‍රේෂණ මෙරට ඉහළම විදේශ විනිමය මූලාශ්‍රය බවට පත්ව ඇති අතර 2014 වර්ෂය තුලදී ලැබුණු සමස්ත ප්‍රේෂණ ප්‍රමාණය ඇ.ඩොලර් මිලියන 7,018 ක අගයක් ගන්නා ලදී. මෙම අගය රුපියල් මිලියන 916,367 ක වටිනාකමට සමානවේ.එය 2013 වර්ෂයට සාපේක්ෂව 9.54% ක වර්ධනයකි. මෙම ප්‍රේෂණ ගලනයේ තවත් සුවිශේෂී ලක්ෂණයක් වන්නේ එය ශ්‍රී ලංකාවේ වඩාත් දුෂ්කර ප්‍රදේශ කරා ළඟා වීමයි. එම ප්‍රේෂණ වෙනත් බොහෝ සංවර්ධන ආධාර හා සැසඳීමේදී දිළිඳු බව අඩු කිරීමේ හා ආර්ථික වශයෙන් ඵලදායී ප්‍රයෝජන රාශියක් අත්පත් කර දී ඇත.

විදේශ රැකියා ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා වන වර්තමාන ප්‍රතිපත්තිය වනුයේ, වඩා ඉහල ඉපයීම් ධාරිතාවක් සහ රැකියා හා සබැඳි අවම ගැටළු සංඛ්‍යාවක් සහිත පුහුණු හා වෘත්තීය කාණ්ඩ වෙත ශ්‍රමිකයන් සැපයීම සහ එකී නව රැකියා ප්‍රභවයන් සොයා යැමයි. රටවල් ගණනාවක් අළුතින්ම ශ්‍රම වෙළඳපලට පිවිසීමත් ඔවුන් වත්මන් රැකියා වෙළඳපොළ ඉල්ලුමට සරිලන ආකාරයේ වඩාත් ගුණාත්මක භාවයෙන් යුතු පුහුණු ශ්‍රමිකයින් ශ්‍රමවෙළඳපොළට සැපයීමත් හේතුවෙන් ශ්‍රම විගමණය තරඟකාරී මට්ටමට පැමිණ ඇත.

ඇතිවිය හැකි අවධානම් සාධක සැලකිල්ලට ගනිමින්, මෙම කර්මාන්තය පෝෂණය කර සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සියළු පියවර ගැනීම අතිශයින් වැදගත් වේ.ඒ සඳහා විදෙස් රැකියා සඳහා යොමුවන්නන්ගේ කුසලතාවයන් වැඩි දියුණු කිරීම, විදේශ රැකියා ක්ෂේත්‍රය තුල ඔවුන්ට ස්වාභිමානයක් ඇති කිරීම, විදෙස් රැකියා වෙළඳපලේ පවතින ඉල්ලුමට සරිලන ශ්‍රමිකයෙකු නිර්මාණය කිරීම සහ ඔවුන්ට ඉහල වැටුපකට හිමිකම් කීමට අවස්ථාවක් සලසා දීම යනාදී කරුණු කෙරෙහි අප අමාත්‍යාංශය මේ වන විටත් වැඩි අවධානයක් යොමු කර ඇත.

ශ්‍රමික සංක්‍රමණ ප්‍රතිපත්තිය සහ යහපත් සේවා නියුක්ති මූලධර්මයන්ට අනුගත වෙමින් වඩාත් සුරක්ෂිත විදේශ රැකියා නියුක්තිය සහතික කිරීම පිණිස දකුණු කොරියාව , ඊශ්‍රායලය වැනි රටවල් සමග ශ්‍රමික විගමනය පිළිබඳව අවබෝධතා ගිවිසුම් යාවත්කාලීන කිරීමට ලැබීමත් කලාපීය සහයෝගීතාවය ලබාගනිමින් මෙම වර්ෂයේ නොවැම්බර් මස මුලදී ආසියාවේ ශ්‍රම විගමන රටවල් 11කින් සමන්විත කොළඹ ක්‍රියාදාමයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ තුන්වන රැස්වීම කොළඹදී පැවැත්වීමට අපට හැකිවිය. මීට අමතරව ජපානය, සයිප්‍රසය හා ලිතුවේනියාව වැනි ඉහළ වැටුප් හා සුරක්ෂිත සමාජ තත්වයකින් යුත් රටවල් කිහිපයක් සමග මෙරට ශ්‍රමිකයින් සඳහා ලබාදිය හැකි රැකියා අවස්ථා පිළිබඳව සාකච්ඡා කිරීමට හැකිවීමත් එහි පළමු පියවර ලෙස සයිප්‍රස් රාජ්‍ය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට අවශ්‍ය මූලික අඩිතාලම දැමීමට හැකිවීමත් අප ලද ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය.

වඩා කාර්යක්ෂම සේවාවක් සැපයීම සහ අමාත්‍යාංශයේ අරමුණු සපුරා ගැනීම සඳහා ගරු අමාත්‍යතුමියගෙන් ලත් මහ පෙන්වීමත් එතුමියගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයෙන් ලැබුණු නොමඳ සහයෝගයද මා අතිශයින් අගය කරමි. එසේම අමාත්‍යාංශයේ, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය යන ආයතනවල සියළු කාර්ය මණ්ඩලයෙන් ලද ඉහල මට්ටමේ සහයෝගය විශේෂයෙන්ම මෙහිදී මම සඳහන් කිරීමට කැමැත්තෙමි.

**ජී එස් විතානගේ**
**ලේකම්**

## පටුන

**පිටු අංකය**

**පසුබිම**


- රැකියා සඳහා විගමනයෙහි වර්ධනය ix-xi
- ජාතික ආර්ථිකයට විගමනික ශ්‍රමිකයින්ගේ දායකත්වය xii-xiii
- විගමනික ශ්‍රමිකයන් සඳහා සුබසාධන වැඩසටහන් xiii

**1 විදේශ රැකියා අමාත්‍යාංශය**

1.1 විදේශ රැකියා අමාත්‍යාංශය පිහිටුවීම 1
1.2 අමාත්‍යාංශයෙහි දැක්ම
1.3 අමාත්‍යාංශයෙහි මෙහෙවර
1.4 අමාත්‍යාංශයෙහි ප්‍රධාන කාර්යභාරයන්
1.5 නීති පැනවීම 2-4
1.6 ළඟාකර ගැනීම් හා අනාගත ක්‍රියාකාරකම් 4-6
1.7 මූල්‍ය කාර්ය සාධනය 7

**2 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**

2.1 උපාය මාර්ගික දිශානතිය 8
2.2. කාර්යාංශයේ අරමුණු හා ප්‍රතිපත්ති

**3 2015 ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා කාර්යය සාධනය**

**3.1 යහපාලනය ක්‍රියාත්මක කිරිම**

- විදේශ රැකියා නියෝජිතායතන ලියාපදිංචි කිරිම 9-10
- විදේශ රැකියා ඇනවුම් සඳහා අනුමැතිය ලබාදීම 10-11
- විදේශගත කිරීම සඳහා අනුමැතිය ලබාදීම (පිටත්වීම්) 11-12
- රැකියා ගිවිසුම් ලියාපදිංචි කිරිම 12
- ඇඟිලි සලකුණු පරීක්ෂා කිරීම
- බලපත්‍රලාභී/බලපත්‍රලාභී නොවන නියෝජිත ආයතනවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම. 12-14

**3.2 විගමනික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ ආරක්ෂාව හා සුබසාධනය**

3.2.1 නැවත පැමිණෙන විගමනික ශ්‍රමිකයන් සඳහා ලබා දෙන සහය 15
3.2.2. සුබසාධන ක්‍රියාකාරකම්

- රක්ෂණ ප්‍රතිලාභ 15-16
- විගමනික ශ්‍රමිකයන් සඳහා අඩු පොළී ණය ලබා දීම 16
- විගමනික ශ්‍රමිකයන්ගේ දූ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම. 17
- ළමා ආරක්ෂණ වැඩසටහන
- අනෙකුත් සුබසාධන සේවා 18
- විගමනික ශ්‍රමිකයින් නැවත ගෙන්වා ගැනීම
- නැවත ගෙවීමේ තැන්පතුව 19

- සේවක සුබසාධන අරමුදල යටතේ සහන සැලසීම
- ආබාධිත විගමනික ශ්‍රමිකයින් සඳහා සහන සැලසීම 20
- රෝහල් පහසුකම් සැලසීම
- විගමනික ශ්‍රමිකයින් සඳහාවූ වෙනත් සහන
- එතෙරදී සිදුවූ විගමණික සේවක මරණ 21
- සේවක සුබසාධන අරමුදල් කමිටු රැස්වීම් සහ තානාපති කාර්යාල සඳහා අනුයුක්ත කිරීම
- මෙරටට පැමිණි සහ මෙරටින් යවන ලද දූත මණ්ඩල
- විගමනික ශ්‍රමිකයන්ගේ දරුවන් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන 22
  බහු මාධ්‍ය විදෙස් භාෂා පුහුණු මධ්‍යස්ථානය
- ගුවන් ටිකට් පත් ඒකකය 22-23
- පැය 24/7 තොරතුරු මධ්‍යස්ථානය 23

3.2.3. විගමනික ශ්‍රමිකයින්ගේ හැකියාවන් හා කුසලතා වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- රැකියා අපේක්ෂකයින් සඳහා “ජාතික වෘත්තීය සුදුසුකම් III” (NVQ III) මට්ටම පුහුණු වැඩසටහන් පැවැත්වීම 23-24
- මැදපෙරදිග රැකියා අපේක්ෂකයින් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
  - ගෘහස්ථ සේවය සඳහා පුහුණුව 24-25
  - සාක්ෂරතා පුහුණුව 25
  - ගෘහස්ථ නොවන ශ්‍රමිකයන් සඳහා පුහුණුව
- මැදපෙරදිග නොවන රටවල රැකියා අපේක්ෂකයින් සඳහා පුහුණුව
  - ගෘහස්ථ පුහුණුව- සයිප්‍රස් 26
  - ගෘහස්ථ පුහුණුව- සිංගප්පූරුව
  - උපස්ථායක පුහුණුව - ඊශ්‍රායල්
  - පෙර විගමනික පුහුණු වැඩසටහන - දකුණු කොරියාව 26-27

**3.3 විගමනය සහ සංවර්ධන ක්‍රියාවලියේ සම්බන්ධතාවය**

3.3.1 ශ්‍රී ලාංකිකයින් සඳහා වඩාත් වාසිදායක රැකියා අවස්ථා ශ්‍රී ලංකාවෙන් පිටත ප්‍රවර්ධනය කිරීම
- රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ ශ්‍රී ලාංකිකයින් දකුණු කොරියාවේ රැකියා සඳහා බඳවා ගැනිම 27
- විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය -දකුණු කොරියාව 28
- ශ්‍රී ලාංකිකයන් ඉතාලි රැකියා සඳහා යොමු කිරීම 28-29
- රැකියා බැංකුව (On line Job Bank) 29

3.3.2 ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම
- ප්‍රවර්ධන වැඩසටහන් (දේශිය) 29-30
- උපාය මාර්ගික සම්බන්ධතා ගොඩනැඟීම 30
- කොළඹ පිහිටි බ්‍රිතාන්‍ය කවුන්සලය සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම 30-31

3.3.3 සේවයේ ගුණාත්මකභාවය ඉහළ නැංවිම 31
- ආගමන විගමන දෙපාර්තමේන්තුව සමඟ විගමනික ශ්‍රමිකයන්ගේ දත්ත හුවමාරු කර ගැනීමේ වැඩසටහන

- විගමනික ශ්‍රමිකයන් හඳුනා ගැනීමේ ජීව මිණුම් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම (ඇඟිලි සලකුණු ලබා ගැනීම)
- විදේශ රැකියා ඇණවුම්/ඇබෑර්තු සහ වෙළඳ දැන්වීම් කාර්යාංශ වෙබ් අඩවියේ පල කිරීම 32
- පැමිණිලි විසඳීමේ යාන්ත්‍රණය විමධ්‍යගත කිරීම
- සමථකරණ වැඩසටහන් 32-34
- පවුල් පසුබිම් වාර්තාව 34
- ගෘහස්ථ සේවකයින් සඳහා අවම වයස් සීමාව

3.3.4. විදේශ රැකියා ප්‍රවර්ධනය සඳහා කලාපීය සහයෝගීතාවය
- කොළඹ ක්‍රියාදාමය 35-36

3.3.5. කාර්යාංශ අනාගත සැළසුම්
- විගමනික සම්පත් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම 36
- විගමනික සම්පත් මධ්‍යස්ථානය- හෝමාගම 36-37
- විගමනික සහයක මධ්‍යස්ථානය- රත්නපුර 37
- විගමනික සම්පත් මධ්‍යස්ථානය- හාලිඇල
- විගමනික සම්පත් මධ්‍යස්ථානය- කුරුණෑගල
- සංචාරක බංගලාව -කතරගම
- විගමනික සම්පත් මධ්‍යස්ථානය - මතුගම (අමතර ගොඩනැඟිලි ඉදි කිරීම)
- විගමනික සම්පත් මධ්‍යස්ථානය- අනුරාධපුරය 38
- විගමනික සම්පත් මධ්‍යස්ථානය- ත්‍රිකුණාමලය
- විගමනික සම්පත් මධ්‍යස්ථානය- කටුනායක

3.3.6. මූල්‍ය කාර්ය සාධනය
- 2015 වර්ෂය සඳහා ආදායම් වියදම් සාරාංශය 39
- 2014 වර්ෂය සඳහා ආදායම් වියදම් සාරාංශය 40

## 4 . ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය

4.1. හැඳින්වීම 41
i. දැක්ම
ii. මෙහෙවර
iii. අරමුණ

4.2. ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සියේ ප්‍රධාන කාර්යයන්
i. බඳවාගැනීමේ අංශය 42
ii. මූල්‍ය අංශය
iii. පරිපාලන හා මානව සම්පත් අංශය 42-43
iv. තොරතුරු තාක්ෂණ අංශය 43
v. විගමණික ශ්‍රමික රක්ෂණ අංශය

4.3. ඉලක්ක කරා ළඟා වීම - ජනවාරි සිට දෙසැම්බර් 2015
i. බඳවාගැනීමේ අංශය 44-45
ii. මූල්‍ය අංශය 46
iii. පරිපාලන හා මානව සම්පත් අංශය
iv. තොරතුරු තාක්ෂණ අංශය 46-47
v. විගමණික ශ්‍රමික රක්ෂණ අංශය 47-48

4.4. ක්‍රියාත්මක කළයුතු අනාගත බලාපොරොත්තු හා වැඩසටහන්
i. බඳවාගැනීමේ අංශය 48
ii. මූල්‍ය අංශය 49
iii. පරිපාලන හා මානව සම්පත් අංශය
iv. තොරතුරු තාක්ෂණ අංශය
v. විගමණික ශ්‍රමික රක්ෂණ අංශය

4.5. මූල්‍ය කාර්ය සාධනය 50

# 1.පසුබිම

## රැකියා සඳහා විගමනයෙහි වර්ධනය

ශ්‍රමිකයින් සපයන්නාවූ අනෙකුත් බොහෝ ආසියානු රටවලට මෙන්ම ශ්‍රී ලංකාවේද ජාත්‍යාන්තර ශ්‍රමික ගමනය හා සම්බන්ධව මෑත ඉතිහාසයේ වඩාත්ම කැපී පෙනෙන සමය සලකුණුවූයේ 1970 ගණන්වල තෙල්වලට ඇතිවූ වාසිදායක වෙළඳපොල වර්ධනය වීමෙන් අනතුරුව මැදපෙරදිග හා සමහර ආසියානු රටවල රැකියා මාර්ග මතුවීමත් සමගය.

ශ්‍රී ලංකාව මැද පෙරදිග සහ අප්‍රිකානු ශ්‍රම වෙළඳපලට අවතීර්ණවීම, රටේ ආර්ථිකය හා සමාජ ජීවිතය යන දෙකම කෙරෙහි සාර්ව මෙන්ම සූක්ෂම මට්ටමේ බලපෑම් සහිතව සමස්ත විගමන කර්මාන්තයෙහිම සුවිශේෂී සංවර්ධනයක් සලකුණු කළ අතර පසුගිය දශක දෙකක පමණ කාලයක් තිස්සේ එහි විවිධ ධනාත්මක හා සෘණාත්මක මානයන් විවිධ පර්යේෂකයන් හා ප්‍රතිපත්ති සැළසුම්කරුවන් විසින් සාකච්ඡාවට භාජනයකර ඇත.
දැනට ලබාගත හැකි සංඛ්‍යාලේඛන වලට අනුව 1986 සිට ඉදිරියට, විශේෂයෙන්ම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පිහිටුවීමෙන් පසුව,මෙහි අඛණ්ඩ වර්ධන ප්‍රවණතාවක් පැහැදිලිව දක්නට ලැබේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පිහිටුවීමෙන් අනතුරුව ඇති දත්ත වලට අනුව 30 වසරක කාල සීමාව තුළ රටෙන් බැහැර යන සංඛ්‍යාව 1985 තිබූ 14,456 සිට 2015 දී 263,307දක්වා වර්ධනය වූ බව මෙම දත්ත තවදුරටත් පෙන්නුම් කරයි. දත්තවල සමීප විශ්ලේෂණයක් තවදුරටත් දක්වන්නේ නම් කාන්තා සහභාගිත්වය 1988 දී ප්‍රථම වරට පිරිමින්ගේ සංඛ්‍යාව අභිබවා ගිය බව සහ මෙම ආධිපත්‍ය 2007 දක්වා පවත්වා ගන්නා ලද බවත්ය. ගෘහ අංශයේ රැකියා හා ඇඟලුම් කම්හල්වල රැකියා සඳහා විගමනය වූ වැඩි සංඛ්‍යාවක් කාන්තාවන් වීම, කාන්තා කොටසේ ඉහළ නැගීමේ ප්‍රවණතාවට හේතුවිය. කෙසේ වෙතත් වසර 20 කට පසුව 2008 දී ඉතා පටු ආන්තිකයක් වන කාන්තාවන් 48.81% කට පිරිමින් 51.19% වශයෙන් පිරිමින් සංඛ්‍යාව කාන්තාවන් අභිබවා ගොස් ඇත. මෙය 2009 දී නැවත වෙනස් වූ නමුත් 2010 වන විට පිරිමි විගමනය කුඩා ආන්තිකයකින් කාන්තා විගමනය ඉක්මවා ගොස් තිබිණි. (පිරිමි 51.16 කාන්තාවන් 48.84% වශයෙනි).

2014 වර්ෂයේ මුළු පිටවීම් සංඛ්‍යාව 300,703 ද, 2015 වර්ෂයේ මුළු පිටත්වීම් සංඛ්‍යාව 263,307 වන අතර මෙය 2014 වර්ෂයට වඩා 12.44 % ක අඩු වීමකි. කෙසේ නමුත් 2015 වර්ෂයේ පිරිමි ප්‍රතිශතය 2014 වර්ෂයට සාපේක්ෂව 9.24 % ක් දක්වා අඩුවීමක් පෙන්නුම් කරයි.

විදේශ රැකියා සඳහා ඉතා ඉහළම ශ්‍රමික සංඛ්‍යාවක් (300,703) පිටත්වූ වර්ෂය ලෙස 2014 වර්ෂය වාර්තා වන අතර, ඒ අතුරින් 110,486 (36.74%) ක් කාන්තාවන්ද 190,217 (63.26%) ක් පිරිමින්ද විය.2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ පිරිමි ශ්‍රමිකයන්ගේ පිටත්වීම් 8.5% ක් වැනි සැළකිය යුතු මට්ටමින් ඉහළ ගොස් ඇත. තව දුරටත් නිරීක්ෂණය කිරීමේදී 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ මුළු පිටත්වීමේ ප්‍රමාණය 12.44 % න් පහළ ගොස් ඇත. (2014 වර්ෂයේ 300,703සහ 2015 වර්ෂයේ 263,307).

2015 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ රැකියා වෙළඳ පොළෙන් 88.38% ක් වන වැඩිම ශ්‍රම බලකායක් ලබා ගත් රටවල් ලෙස සවුදි අරාබියාව, කටාර්, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, කුවේට්, හා ඕමාන් නම් කළ හැකිය.

## රැකියා සඳහා පිටත්වීම්

| වර්ෂය | පිරිමි | | ගැහැණු | | සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | |
| 1986 | 11,023 | 76.25 | 3,433 | 23.75 | 14,456 |
| 1987 | 10,647 | 75.37 | 3,480 | 24.63 | 14,157 |
| 1988 | 8,309 | 45.09 | 10,119 | 54.91 | 18,428 |
| 1989 | 8,680 | 35.11 | 16,044 | 64.89 | 24,724 |
| 1990 | 15,377 | 36.08 | 27,248 | 63.92 | 42,625 |
| 1991 | 21,423 | 32.97 | 43,560 | 67.03 | 64,983 |
| 1992 | 34,858 | 28.00 | 89,636 | 72.00 | 124,494 |
| 1993 | 32,269 | 25.00 | 96,807 | 75.00 | 129,076 |
| 1994 | 16,377 | 27.22 | 43,791 | 72.78 | 60,168 |
| 1995 | 46,021 | 26.68 | 126,468 | 73.32 | 172,489 |
| 1996 | 43,112 | 26.52 | 119,464 | 73.48 | 162,576 |
| 1997 | 37,552 | 24.99 | 112,731 | 75.01 | 150,283 |
| 1998 | 53,867 | 33.71 | 105,949 | 66.29 | 159,816 |
| 1999 | 63,720 | 35.45 | 116,015 | 64.55 | 179,735 |
| 2000 | 59,793 | 32.82 | 122,395 | 67.18 | 182,188 |
| 2001 | 59,807 | 32.50 | 124,200 | 67.50 | 184,007 |
| 2002 | 70,522 | 34.61 | 133,251 | 65.39 | 203,773 |
| 2003 | 74,508 | 35.51 | 135,338 | 64.49 | 209,846 |
| 2004 | 80,699 | 37.59 | 134,010 | 62.41 | 214,709 |
| 2005 | 93,896 | 40.60 | 137,394 | 59.40 | 231,290 |
| 2006 | 90,170 | 44.65 | 111,778 | 55.35 | 201,948 |
| 2007 | 103,476 | 47.37 | 114,983 | 52.63 | 218,459 |
| 2008 | 128,232 | 51.19 | 122,267 | 48.81 | 250,499 |
| 2009 | 119,381 | 48.31 | 127,745 | 51.69 | 247,126 |
| 2010 | 136,850 | 51.16 | 130,657 | 48.84 | 267,507 |
| 2011 | 136,307 | 51.84 | 126,654 | 48.16 | 262,961 |
| 2012 | 143.784 | 50.93 | 138,547 | 49.07 | 282,331 |
| 2013 | 175,045 | 59.72 | 118,058 | 40.28 | 293,105 |
| 2014 | 190,217 | 63.26 | 110,486 | 36.74 | 300,703 |
| 2015 | 172,630 | 65.56 | 90,677 | 34.44 | 263,307* |

වගුව **-1** (මූලාශ්‍රය ශ්‍රී.ල.වි.සේ. නි. කා.)* වෙනස්විය හැක

## 2014 හා 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා විදේශ ගතවීම් වල සංසන්දනාත්මක වාර්තාව

| | **2014** (ජන. - දෙසැ. ) | **2015** (ජන. - දෙසැ. ) | වර්ධනය |
|---|---|---|---|
| | සංඛ්‍යාව | සංඛ්‍යාව | % |
| පිරිමි | 190,217 | 172,630 | -9.25 |
| කාන්තා (ගෘහ සේවිකා හැර) | 21,858 | 17,399 | -20.40 |
| ගෘහ සේවිකා/ගෘහ පාලිකා සහායක | 88,628 | 73,278 | -17.31 |
| එකතුව(කාන්තා) | 110,486 | 90,677 | -17.93 |
| එකතුව | 300,703 | 263,307 | -12.44 |

වගුව-2 (මූලාශ්‍රය-තොරතුරු තාක්ෂණ අංශය - ශ්‍රී.ලං.වි.සේ. නි. කා.)


2015 වර්ෂය තුළ 263,307ක් වූ මුළු පිටවීම් සංඛ්‍යාවෙන් පිරිමි ශ්‍රමිකයින්ගේ සහභාගීත්වය 172,630 (65.56 %)ක් ලෙස ඉහළ ගොස් ඇති අතර, කාන්තා ශ්‍රමිකයින්ගේ සහභාගීත්වය90,677 (34.44%)ක් වැනි අගයක් තුළ පවතියි. මෙම කාලය තුල මුළු පිටවීම් සංඛ්‍යාවෙන් 73,278 (27.82%)ක් ගෘහසේවිකා/ගෘහ පාලිකා සහායකයින් වේ.

2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ පිරිමි ශ්‍රමිකයින්ගේ විගමනය -9.24% කින් ද ගෘහ සේවිකා නොවන කාන්තා ශ්‍රමිකයින්ගේ විගමනය -20.40% කින් ද අඩු වී ඇති අතර ගෘහ සේවිකා/ ගෘහ පාලිකා සහායකයින්ගේ විගමනය -17.32% කින් අඩු වී ඇත. ඒ අනුව, 2014 වර්ෂයට සාපේක්ෂව 2015 මුළු පිටත්වීම් ප්‍රමාණය -12.44% කින් අඩුවී ඇත. (උදා - 300,703ක් 2014 හා 263,307ක් 2015 වසරවලදී).

මේ අයුරින් කාන්තා සේවිකාවන්ගේ විදේශ ගත වීම 2014 වසරට සාපේක්ෂව අඩු වීමට හේතු වී ඇත්තේ සමාජ පිරිවැය අඩු කිරීම සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් ගන්නා ලද පහත සඳහන් නීතිමය ක්‍රියාදාමයන්ය.

- ගෘහස්ථ රැකියා සඳහා විදේශ ගත වන කාන්තාවන්ගේ අවම වයස මට්ටම වැඩි කිරීම (ආරම්භය 2011.02.14)
- ස්වයං මාර්ගයෙන් විදේශගතවන ගෘහස්ථ සේවකයන්ගේ ආරක්ෂාව වෙනුවෙන් (ගෘහපාලිකාවන්) නැවත ගෙවීමේ පදනම මත තානාපති කාර්යාලයේ ඇ.ඩො. 1,000ක ගාස්තුවක් තැන්පත් කිරීමට හෝ නැවත නොගෙවන පදනම මත ඇ.ඩො. 400 ක මුදලක් තැන්පත් කිරීමට (2012.06.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි) කටයුතු කරන ලදී.
- සෞදි අරාබිය, සිංගප්පූරුව, හොංකොං හා සයිප්‍රස් යන රටවල ගෘහස්ථ සේවය සඳහා පිටත්වන ගෘහ පාලිකා සහායකයන්ට ජාතික වෘත්තීය සුදුසුකම් III මට්ටමේ (NVQ Level III) සුදුසුකම් ලැබීම (2013.08.14) දින සිට අනිවාර්යය කර ඇත.
- අවුරුදු 5ට වඩා අඩු දරුවන් සිටින කාන්තාවන් විදේශගතවීම වැළැක්වීමේ අරමුණින් ගෘහ ආශ්‍රිත රැකියා සඳහා විදේශ ගත වන කාන්තාවන් සඳහා පවුල් පසුබිම් වාර්තාව අනිවාර්යය කිරීම.

**විගමනික ශ්‍රමිකයින්ගේ සංයුතිය**
**2014 සහ 2015 (ජනවාරි සිට දෙසැම්බර් දක්වා)**



## ජාතික ආර්ථිකයට විගමනික ශ්‍රමිකයන්ගේ දායකත්වය

විගමනික ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ, සම්ප්‍රදායික අපනයනයන් වලින් ලැබෙන ආදායම ඉක්මවා යමින් රටේ ඉහළම ශුද්ධ විදේශීය ආදායම් ප්‍රභවය ලෙස සලකුණු වී ඇත.1976 සිට විධිමත් මාර්ග වලින් විදේශගත වන පුද්ගලයින් නිසා මෙම ශ්‍රමික ප්‍රේෂණ ප්‍රමාණය වැඩි වූ අතර තරුණයන් හට විදේශ රැකියා අවස්ථා ලැබීම නිසා විරැකියාවද පහළ මට්ටමක පවතී.

**විදේශ විනිමය ඉපයීම් ප්‍රධාන මූලාශ්‍රයන් 2014 – 2015 (ජනවාරි සිට දෙසැම්බර් දක්වා)**

| වර්ගය | 2014 (ජන-දෙසැ ) එ.ජ.ඩො.මි. | 2015 (ජන-දෙසැ) එ.ජ.ඩො.මි. | වර්ධනය % |
|---|---|---|---|
| ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ | 5,689.7 | 5,787.3 | 1.7 |
| රෙදිපිළි හා ඇඟලුම් | 4,929.9 | 4,820.2 | -2.2 |
| තේ | 1,628.3 | 1,340.5 | -17.7 |
| සංචාරක කර්මාන්තය | 1,956.1 | 2,305.3 | 17.9 |
| රබර් නිෂ්පාදිත | 889.8 | 761.2 | -14.5 |

වගුව-3 (මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව)

**ශ්‍රමික ප්‍රේෂණ 2000 -2015**

| වර්ෂය | ප්‍රේෂණ | |
|---|---|---|
| | රු. මිලියන | එ.ජ.ඩො.මි. |
| 2000 | 87,697 | 1,160 |
| 2001 | 103,180 | 1,155 |
| 2002 | 123,183 | 1,287 |
| 2003 | 136,475 | 1,414 |
| 2004 | 158,291 | 1,564 |
| 2005 | 195,256 | 1,918 |
| 2006 | 224,663 | 2,161 |
| 2007 | 276,728 | 2,502 |
| 2008 | 316,091 | 2,918 |
| 2009 | 382,818 | 3,330 |
| 2010 | 465,166 | 4,116 |
| 2011 | 569,103 | 5,145 |
| 2012 | 763,980 | 5,985 |
| 2013 | 827,689 | 6407 |
| 2014 | 916,367 | 7,018 |
| 2015 | 948,936.31 | 6,980.2* |

වගුව-4 (මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව) * වෙනස්විය හැක

ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා වලට අනුව 2015 වර්ෂය තුල ශ්‍රමික ප්‍රේෂණ ඇ.ඩො.මි. 6,980.2 (රු.මි. 948,936.31) දක්වා පහළ ගොස් ඇත.2014 වර්ෂය තුල ශ්‍රමික ප්‍රේෂණ ඇ.ඩො.මි. 7,018 (රු.මි. 916,367) වේ. මේ අනුව 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ ශ්‍රමික ප්‍රේෂණ ප්‍රමාණය 0.54 % ක පහළ යෑමක් පෙන්නුම් කරයි.

| ශ්‍රමික ප්‍රේෂණ - 2014 / 2015 (ජනවාරි - දෙසැම්බර්) | | | |
|---|---|---|---|
| මාසය | 2014 (එ.ජ.ඩො.මි.) | 2015 (එ.ජ.ඩො.මි) | වර්ධනය % |
| ජනවාරි | 555.5 | 523.5 | -5.76 |
| පෙබරවාරි | 502.0 | 511.6 | 1.91 |
| මාර්තු | 605.9 | 644.3 | 6.33 |
| අප්‍රේල් | 554.0 | 585.9 | 5.75 |
| මැයි | 557.5 | 537.7 | -3.55 |
| ජූනි | 585.1 | 629.6 | 7.60 |
| ජූලි | 606.7 | 599.3 | -1.21 |
| අගෝස්තු | 548.1 | 566.0 | 3.3 |
| සැප්තැම්බර් | 575.0 | 584.2 | 1.6 |
| ඔක්තෝබර් | 600.1 | 605.1 | 0.8 |
| නොවැම්බර් | 619.3 | 574.5 | -7.2 |
| දෙසැම්බර් | 708.8 | 618.5 | -12.7 |
| **එකතුව** | **7018.0** | **6980.2** | **-3.13** |

**වගුව-5** **(මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව)**

2014 වර්ෂයට (ඇ.ඩො.මිලි. 7018/රු.916,367) සාපේක්ෂව 2015 (ඇ.ඩො.මිලි.6980.2/රු. 948,936.31) වර්ෂය තුල ශ්‍රමික ප්‍රේෂණවල 0.54 % ක පහළ යෑමක් පෙන්නුම් කර ඇත.

## විගමනික සේවකයන් සඳහා සුබසාධන වැඩසටහන්

ශ්‍රී ලංකාව, එක්සත් ජාතීන්ගේ විගමනික ශ්‍රමිකයින් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන්ගේ ආරක්ෂාව හා අයිතිවාසිකම් සුරැකීම පිළිබඳ සම්මුතිය හා බැඳී ඇත.මෙම සම්මුතියට අනුව විගමනික සේවකයන්ගේ හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන්ගේ සුබසාධනය හා ආරක්ෂාව වෙනුවෙන් වැඩසටහන් දියත් කර ඇත. ඉන් ප්‍රධාන වැඩසටහන් කිහිපයක් පහතින් දක්වා ඇත.

1. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ලබාගත් සෑම විගමනික ශ්‍රමිකයකු සඳහාම නොමිලේ ජීවිත ආරක්ෂණ රක්ෂණ ආවරණයක් ලබාදිම.
2. විශේෂ ඉලක්ක සපිරූ විගමනික සේවකයින්ගේ දූ දරුවන් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම.
3. රාජ්‍ය බැංකු හරහා පෙර විගමනික ණය ලබා දීම.
4. ගෘහස්ථ සේවයේ රැකියා සඳහා පිටත්වන කාන්තාවන්ට හා ගෘහස්ථ නොවන සේවයේ කාන්තා හා පිරිමි අය සඳහා ලබාදිය යුතු පුහුණු පාඨමාලා දිවයින පුරා පිහිටි විදේශ සේවා නියුක්ති කාර්යාංශ පුහුණු මධ්‍යස්ථාන වලදි පැවැත්වීම.
5. විදේශගත වී අතරමං වූ හා කරදරයට පත්වූ අයට නැවත පැමිණීමට ගුවන් ටිකට්පත් ලබාදිම.
6. විදේශ රටවල පවත්වාගෙන යන සහන නිවාස වල නිසි පිළිසරණක් නොමැති වූ විගමනික කාන්තාවන්ට සහන සලසනු ලබන අතර රජයේ වියදමින් වෛද්‍ය පහසුකම් ආහාර හා ප්‍රවාහන පහසුකම් සපයනු ලැබේ.
7. විගමනික ශ්‍රමිකයින් රැකියාවන් සඳහා වැඩි වශයෙන් විගමනය වන රටවල දූත මණ්ඩලවලට විගමනික සේවකයින්ගේ යහපත සඳහා සුබසාධන නිලධාරින් පත් කිරීම.
8. ගුවන් තොටුපල ආසන්නයේ පිහිටුවා ඇති සහන පියස සුබසාධන මධ්‍යස්ථාන මගින් නොයෙක් අසනීප තත්ත්වයන්ට හා කරදරයට ලක්වූ අය සඳහා සහන සලසනු ලැබේ.

# 1. විදේශ රැකියා අමාත්‍යාංශය

## 1.1.විදේශ රැකියා අමාත්‍යාංශය පිහිටුවීම

ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයන් විසින් රටේ ජාතික ආර්ථිකයට ලබා දෙන වැදගත් දායකත්වයන් අවබෝධ කරගන්නා ලදුව, 2007.02.20 වැනි දින විදේශ රැකියා ප්‍රවර්ධනය උදෙසා වෙනම අමාත්‍යාංශයක් පිහිටුවන ලදී. පසුව 2010.04.22 වැනි දින මෙය විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ කෙරිණි. විගමනික ශ්‍රමිකයන්ගේ සුබසාධනය ප්‍රවර්ධනය කිරීම පිණිස 2010.11.22 වැනි දින අංක 1681 - 3 දරන විශේෂ ගැසට් නිවේදනය මගින් මෙම අමාත්‍යාංශය විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය ලෙස යළි පිහිටුවනු ලැබිණි. පොදුවේ ඩයස්පෝරාව ලෙස හැඳින්වෙන එතෙර වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ සුබසාධනය ප්‍රවර්ධනය කිරීමේ අමතර කාර්යයක් මෙම නව අමාත්‍යාංශය වෙත පැවරී ඇත. සාර්ක් කලාපයට අයත් ඉන්දියාව, පකිස්ථානය සහ බංගලාදේශය යන රටවල ක්‍රමවේදය අනුගමනය කරමින් ශ්‍රී ලාංකාවේද විගමණික ශ්‍රමිකයන් සංවර්ධනය හා සුබසාධනය සඳහා වෙනම අමාත්‍යාංශයක් පිහිටුවීමට කටයුතු කරන ලදී. ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා 2015.01.08 වන දින ජනාධිපති ලෙස පත්වීමෙන් පසුව නව රජයේ නව ඇමති මණ්ඩලය දිවුරුම් දීමත් සමඟ විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය, විදේශ රැකියා අමාත්‍යාංශය ලෙස නම් කොට එහි විෂය භාර අමාත්‍යවරයා වශයෙන් ගරු තලතා අතුකෝරල මැතිනිය පත් කරන ලදී.

## 1.2.අමාත්‍යාංශයෙහි දැක්ම

විගමනික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ඔවුන්ගේ සුබසාධනය සහතික කිරීම සිදු කරන අතරම වාසිදායක විදේශ රැකියා අවස්ථා නිර්මාණය කිරීමෙහිලා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ප්‍රමුඛ ආයතනය බවට පත් කිරීම.

## 1.3.අමාත්‍යාංශයෙහි මෙහෙවර

සමස්ත ශ්‍රම විගමන අංශයම ඉල්ලුම මගින් මෙහෙයවෙන ක්‍රියාවලියක් බවට පරිවර්තනය කිරීම හා ජාතික ආර්ථිකය කෙරෙහි ශ්‍රම විගමන අංශයෙහි දායකත්වයෙහි වැදගත්කම අවබෝධ කරගනිමින්, ජාත්‍යන්තර වෙළඳපොල අභියෝග වලට මුහුණ දීම පිණිස අවශ්‍ය ප්‍රවර්ධනාත්මක හා සුබසාධන ක්‍රියාකාරකම් මෙන්ම ව්‍යුහමය වෙනස්කම්ද හඳුන්වාදීම මගින් අතිශයින් තරඟකාරී ආයතනයක් බවට පත් කිරීම.


## 1.4.අමාත්‍යාංශයෙහි ප්‍රධාන කාර්යභාරයන්

1. විදේශ රැකියා විෂයට සහ ඊට අනුබද්ධ ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.
2. සංක්‍රමණික සේවා නියුක්තිකයන්ගේ වෘත්තීමය ගැටළුවලට පිළියම් ලබාදීම සහ සුබසාධනය ඉහළ දැමීම.
3. විදේශගත ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා නව නීති හඳුන්වා දීම.
4. රැකියා නියෝජිතායතන නියාමනය සහ අධීක්ෂණය කිරීම.
5. විදේශ රැකියා සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය සැපයීම.
6. ලයිස්තුගත ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාල කටයුතු සම්බන්ධීකරණය සහ නියාමනය
7. ලයිස්තුගත ආයතන අධීක්ෂණය කිරීම.

## 1.5.නීති පැනවීම


ශ්‍රම විගමනය පරිපාලනය සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායක සැලසුම් මෙයට පෙර පාලනය වූයේ 1956 අංක 37 දරණ ගාස්තු අය කරන රැකී රක්ෂා ඒජන්සි පනතේ විධිවිධාන මගිනි. මෙම පනත, දේශීය හා විදේශීය යන දෙආකාරයේම රැකියා නියුක්ති කාර්යන් සඳහා ශ්‍රමිකයන් බඳවා ගැනීම හා සම්බන්ධ නියෝජිත ආයතන අධීක්ෂණය කිරීමට කම්කරු කොමසාරිස්වරයාට බලය ලබා දෙයි. 1980 දී නව පනතක්, එනම් අංක 32 දරණ විදේශ රැකියා නියුක්ති නියෝජිත ආයතන පනත පාර්ලිමේන්තුව විසින් බලාත්මක කරන ලද්දේ එතෙර රැකියා සඳහා ශ්‍රී ලාංකිකයන්ගේ අඛණ්ඩ හා වැඩි වූ ගලා යාම හමුවේ කර්මාන්තයේ සීඝ්‍රයෙන් ඉහළ නගින අවශ්‍යතා පාලනය කිරීමේ අරමුණ ඇතිවය. 1985 දී අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත මගින් පුළුල් නීතිමය රාමුවක් සහිතව හා සමස්ත කර්මාන්තය සංවර්ධනය හා කළමනාකරණය කිරීම සඳහා පුළුල් පරාසයක වූ දීර්ඝකාලීන අරමුණු සහ වගකීම් සහිතව මෙම කාර්යය සඳහා කැප කරන ලද්දා වූ වෙනම නීතිමය ආයතනයක් ස්ථාපිත කරන ලදී.

## විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන




## ජාතික ශ්‍රම විගමණික ප්‍රතිපත්තිය

අමාත්‍ය මණ්ඩලය විසින් 2009 අප්‍රේල් මසදී අනුමත කරන ලද ශ්‍රම විගමනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය දකුණු ආසියාවේ ප්‍රථම වරට එලෙස හඳුන්වා දුන් ප්‍රතිපත්තිය වේ.




## ජාතික ශ්‍රම විගමන ප්‍රතිපත්තියෙහි කැපී පෙනෙන ලක්ෂණ

1. නිදහස්, සමානාත්මතාවයෙන් යුතු, ආරක්ෂිත හා මානව අභිමානය සුරැකෙන තත්ත්වයන් තුළ යෝග්‍ය හා ඵලදායී රැකියාවල යෙදීම පිණිස විගමනික ශ්‍රමිකයන් වෙනුවෙන් ඇති අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

2. රැකියාවේදී මූලික අයිතිවාසිකම් ආරක්ෂා කෙරෙන ආකාරයේ සේවා පරිසරයක් සහතික කිරීම සඳහා පුහුණු ශ්‍රමික විගමනය ප්‍රවර්ධනය කිරීම හා ඊට සහාය ලබා දීම.

3. ප්‍රතිපත්ති, නීති, නියෝග හා පරිපාලනමය පටිපාටීන් යෙදවීමේදී යහපාලන ප්‍රතිපත්ති වලට අනුකූලව එය සිදු කිරීම.

4. විදේශ විනිමය ප්‍රේෂණ ආකාරයෙන් ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයන් ජාතික ආර්ථිකයට ලබාදෙන කැපී පෙනෙන දායකත්වය පිළිගැනීම.

5. සියලු ආකාරයේ අවිධිමත් විගමනය, පුද්ගල ජාවාරම හා මිනිසුන් නීති විරෝධීව මෙරටට ගෙන ඒම හෝ මෙරටින් ගෙන යාම වැළැක්වීමට ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.

6. තොරතුරු දැනගැනීමේ අයිතිය හා තීරණ ගැනීමේ අයිතිය ක්‍රියාත්මක කිරීම, සියලු අයිතිවාසිකම්, වරප්‍රසාද හා විගමනයෙහි ප්‍රතිලාභ පූර්ණ ලෙස භුක්ති විඳීමට අවස්ථාව සැලසීමෙන් විගමනික ශ්‍රමිකයන් සවිබල ගැන්වීම කෙරෙහි වැදගත්වන ප්‍රතිපත්ති හා වැඩසටහන් වෙත යොමුවීම.

7. පුහුණු කුසලතා සතු වීම සියලු විගමනික ශ්‍රමිකයන්ට රැකවරණය ලැබීමේ ප්‍රධාන අංගයක් බව පිළිගැනීම.

8. මෙම විගමන ක්‍රියාවලියෙහි ප්‍රධාන පාර්ශවකරුවන් ලෙස බඳවාගැනීමේ නියෝජිත ආයතන (රාජ්‍ය හා පුද්ගලික) ලබා දෙන දායකත්වය පිළිගැනීම.

9. ශ්‍රමය ලබාගන්නා රටවල ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල වෙත විගමනික ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව හා සුභසාධක පහසුකම් සැපයීමේ බල පැවරුමක් පැවරීම.

10. ශ්‍රී ලංකාව හා සත්කාරක රටවල් අතර ද්විපාර්ශ්වික එකඟතා සහ අවබෝධතා ගිවිසුම් වල කාර්යභාරය නියාමනය කිරීම.

11. අමාත්‍යාංශය යටතේ විගමනය අධ්‍යයනය කිරීම සඳහා ආයතනයක් පිහිටුවීමේ අවශ්‍යතාව පිළිගැනීම.

## අමාත්‍යාංශය ISO 9001 / 2008 සහතිකය ලබා ගනී.

විදේශ රැකියා අමාත්‍යාංශය මෙන්ම අමාත්‍යාංශයයටතේ පවතින ආයතනද ( ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය) ISO 9001 / 2008 සහතිකය ලබාගන්නා ලදී. ඊට අනුකූලව තත්ත්ව කළමනාකරණ පද්ධතියට අදාළව අමාත්‍යාංශය පහත අවශ්‍යතා ස්ථාපිත කර තිබේ.

- ක්‍රියාදාම හඳුනාගැනීම සහ ප්‍රලේඛනය
- තත්ත්ව අරමුණු ඇති කිරිම
- ලේඛන සහ වාර්තා පාලනය
- සියලු පටිපාටි ප්‍රලේඛනය
- සඵලදායී අභ්‍යන්තර සන්නිවේදන
- සඵලදායී අභ්‍යන්තර පැවැත්ම සහතික කිරීම
- වඩා යහපත් සේවා පරිසරයක් ඇති කිරීම
- අඛණ්ඩ වැඩි දියුණුව සඳහා අවස්ථා

විගාමික සේවකයන්ගේ අයිතිවාසිකම් සහතික කිරීමට ශ්‍රී ලාංකිකයන් සඳහා වාසිදායක විදේශ රැකියා නියුක්තියට අදාළ ප්‍රතිපත්ති නිර්මාණය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සහ සිය තත්ත්ව කළමනාකරණ පද්ධතිය හරහා ඔවුන්ගේ සුබසාධන අවශ්‍යතා සැපයීමට අමාත්‍යාංශය කැපව සිටී.

## 1.6. ළඟාකර ගැනීම්

- රජයේ දින 100 වැඩසටහනට සමගාමීව, විගමණික ශ්‍රමිකයන් වෙනුවෙන් යෝජිත විශ්‍රාම වැටුප් ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේ අවසන් අදියරට ළඟා වී ඇත.
  අමාත්‍ය මණ්ඩලය, මහා භාණ්ඩාගාරය සමඟ මෙම යෝජනාව සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡා කිරීමට මඟ පෙන්වීම ලබාදී ඇත.

- විගමණික ශ්‍රමිකයන්ගේ සුබසාධන කටයුතු ඉහළ නැංවීම සඳහා සියලු දිස්ත්‍රික් ආවරණය වන පරිදි, අමාත්‍යාංශයට අනුයුක්තව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සේවය කරන සංවර්ධන නිලධාරීන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. දැනටමත් රත්නපුර,කොළඹ,මොණරාගල හා යාපනය දිස්ත්‍රික් වැඩසටහන් පවත්වා අවසන් කොට ඇත.

- විගමණික ප්‍රජාවගේ අයිතීන් සහ සුබසාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රම විගමන රටවල් 11කින් සමන්විත කොළඹ ක්‍රියාදාමයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම නොවැම්බර් 04 සහ 05 යන දෙදින තුල කොළඹදී පැවැත්විණි.

- ශ්‍රමිකයන්ලබාගන්නා රටවල්හි නව රැකියා අවස්ථා උදා කර ගැනීම.
  උදා - කුවේට්, කටාර්, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ලෙබනනය, සවුදි අරාබි රාජ්‍යය, ජෝර්දානය, ඕමානය, හොංකොං රාජ්‍යය, සිංගප්පූරුව, මැලේසියාව සහ සයිප්‍රසය

- රැකියා බලපත්‍ර ක්‍රමය (EPS) යටතේ ශ්‍රමිකයන් බඳවා ගැනීම සඳහා කොරියාවේ රැකියා හා කම්කරු අමාත්‍යාංශය සමග අවබෝධතා ගිවිසුමකට එළඹීම.

- කොරියානු රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ 13වන EPS TOPIK කොරියානු භාෂා පරීක්ෂණය 2015 වර්ෂයේ මාර්තු මස 28 දින පවත්වනු ලැබින. මෙම විභාගය සඳහා විභාග ප්‍රවේශ පත්‍ර 2,221 ක් නිකුත් කරන ලද අතර අයදුම්කරුවන් 1,201 ක් "ධීවර" අංශයේ රැකියා සඳහා සුදුසුකම් ලැබීය.

- කොරියානු රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ 14වන EPS TOPIK කොරියානු භාෂා පරීක්ෂණය 2015 වර්ෂයේ ජූනි මස පවත්වනු ලැබිනි. මෙම විභාගය සඳහා විභාග ප්‍රවේශ පත්‍ර 13,082ක් නිකුත් කරන ලද අතර අයදුම්කරුවන් 4,294 ක් "නිෂ්පාදන" අංශයේ රැකියා සඳහා සුදුසුකම් ලැබීය.

- ඊශ්‍රායෙල් රටට ශ්‍රී ලාංකික කෘෂිකාර්මික සේවකයන් බඳවා ගැනීම සඳහා ඊශ්‍රායෙල් රාජ්‍යයේ ජනගහන හා ආගමන විගමන අධිකාරිය (PIBA) සමඟ ගිවිසුමකට එළඹෙන ලදී.

- ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ පවුල් සඳහා සුබසාධන කටයුතුවඩා හොඳින් සැපයීම සහතික කිරීම පිණිසමෙම අමාත්‍යාංශයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගේ රාජකාරි හා සේවා අධීක්ෂණ කටයුතු සඳහාවූ අධීක්ෂණ ඒකකයක් මෙම අමාත්‍යාංශ පරිශ්‍රය තුල ස්ථාපිත කර ඇත.

- විගමණික ශ්‍රමිකයන්ගේ දරුවන්හට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.

- කුවේට්හි ගෘහස්ථ රැකියා වල නියුතු විගමනික සේවකයන් සඳහා, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා එක්ව 2015 සැප්තැම්බර් 1 වන දා සිට විදේශීය රක්ෂණ ක්‍රමයක් ආරම්භ කරන ලදී. මෙය ඉදිරියේ දී සෑම ගල්ෆ් රටක් සඳහාම ක්‍රියාත්මක කෙරෙනු ඇත.

- කාර්යාංශයේ මුදල් ගනුදෙනු සිදු කිරීම සඳහා එහි ප්‍රධාන කාර්යාලය හා සෑම ශාඛා කාර්යාලයක්ම ආවරණය වන පරිදි පරිගණකගත ගිණුම්කරණ පද්ධතියක් ආරම්භ කරන ලදී. මෙම පහසුකම විදේශයන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාල වලද ඉදිරියේ දී ඇති කිරීමට අපේක්ෂිතය.

- ලියාපදිංචි ඒජන්සි ආයතන සඳහා ආචාරධර්ම පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.
  මේ සඳහා ජාත්‍යාන්තර කම්කරු සංවිධානයේ සහය ඇතිව ලියාපදිංචි ඒජන්සි ආයතන 50 ක් සහ ඔවුන්ගේ සහායකයන්ගේද සහභාගීත්වයෙන් පළාත් මට්ටමින් වැඩමුළු පවත්වනු ලැබිණි.

## අමාත්‍යාංශයේ අනාගත සැලසුම්

- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල/පළාත් කාර්යාලවල අමාත්‍යාංශයට අනුයුක්තව සේවය කරන සංවර්ධන නිලධාරීන්ගේ කුසලතා හා හැකියා වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

- ශ්‍රී ලංකා පුහුණු/ වෘත්තීය ශ්‍රමිකයන් සඳහා නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම සඳහා මැද පෙරදිග රටවල් වලට අමතරව අනෙකුත් සමහර යුරෝපීය හා ආසියානු රටවල් සමඟ අවබෝධතා ගිවිසුම් වලට එළඹීම.

- විගමණික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ආරක්ෂා කිරීමත් ඔවුන්ට නිසි පරිදි මඟ පෙන්වීම් කිරීම සඳහා ඔවුන් පිළිබඳ දත්ත හා තොරතුරු එක්රැස් කිරීම.

- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, ගුවන් තොටුපොළ සහ වෙනත් අදාළ අංශ සමඟ සම්බන්ධ වී විගමණික ශ්‍රමිකයන්ගේ සුරක්ෂිත සංක්‍රමණය තහවුරු කිරීම සඳහා තොරතුරු හුවමාරු කර ගැනීම.

- සංක්‍රමණික කම්කරුවන් හා පවුල් සඳහා විධිමත් සේවා සහතික කිරීම වෙනුවෙන් සංවර්ධන නිලධාරීන්ගේ ක්‍රියාකාරකම් සහ සේවා නිරීක්ෂණය කිරීම සඳහා අධීක්ෂණ ක්‍රමවේදය වර්ධනය කිරීම.

- තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේද සහය ඇතිව අඩු කුසලතා සහිත කම්කරුවන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් III මට්ටම හා ඊට ඉහල වැඩසටහන් හඳුන්වා දීම හා පවත්වාගෙන යාම.

- රැකියා සඳහා විදේශ ගතවී නැවත පැමිණෙන විගමණික කම්කරුවන් හා ඔවුන්ගේ පවුල්වල ආර්ථික, සමාජ, මනෝ-සමාජ අංශ ආවරණය කිරීම සඳහා නැවත පැමිණීම හා ඒකාබද්ධ වැඩසටහන් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම.

- රැකියා සඳහා විදේශගතවන ශ්‍රමිකයන් සඳහා විගමණික සම්පත් මධ්‍යස්ථාන ඉදිකිරීම.

## 1.7. මූල්‍ය කාර්ය සාධනය

**182 – විදේශ රැකියා අමාත්‍යාංශය**
**2015.01.01 සිට 2015.12.31 දක්වා මූල්‍ය කාර්ය සාධනය**

| | විස්තරය | ප්‍රතිපාදන | 2015.12.31 දිනට වියදම | ඉතිරි ප්‍රතිපාදන | මූල්‍ය ප්‍රගතිය% |
|---|---|---|---|---|---|
| 1 | පුනරාවර්තන වියදම්<br>පුද්ගල පඩිනඩි | 491,728,000 | 447,265,807 | 44,462,193 | 91 |
| | <u>ගමන් වියදම්</u> | | | | |
| | දේශීය | 26,960,000 | 20,753,234 | 6,206,766 | 77 |
| | විදේශීය | 13,100,000 | 10,760,144 | 2,339,856 | 82 |
| | සැපයීම් | 22,150,000 | 15,041,497 | 7,108,503 | 68 |
| | නඩත්තු වියදම් | 10,800,000 | 8,388,091 | 2,411,909 | 78 |
| | සේවා | 47,150,000 | 35,632,292 | 11,517,708 | 76 |
| | රජයේ සේවකයන්ට දේපළ ණය පොළී | 600,000 | 405,334 | 194,666 | 68 |
| | **මුළු පුනරාවර්තන වියදම්** | **612,488,000** | **538,246,398** | **74,241,602** | **88** |
| 2 | මූලධන වියදම්<br>මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 3,950,000 | 627,375 | 3,322,625 | 16 |
| | මූලධන වත්කම් අත්පත් කරගැනීම් | 5,100,000 | 3,604,296 | 1,495,704 | 71 |
| | මානව සම්පත් සංවර්ධනය | 3,000,000 | 1,905,000 | 1,095,000 | 64 |
| | **<u>වෙනත් මූලධන වියදම්</u>** | | | | |
| | රාජ්‍ය ආයතන වෙත ප්‍රදාන | 175,000,000 | 175,000,000 | - | 100 |
| | විදේශ සේවා නියුක්තිය සංවර්ධනය සඳහාවූ දීප ව්‍යාප්ත පරිපාලන ජාලය ශක්තිමත් කිරීම | 6,000,000 | 5,480,226 | 519,774 | 91 |
| | විදේශ රැකියා ප්‍රවර්ධන වැඩසටහන් | 10,000,000 | 4,495,768 | 5,504,232 | 45 |
| | කුසලතා සංවර්ධන වැඩසටහන් | 330,000,000 | 233,952,613 | 96,047,387 | 71 |
| | **මුළු මූලධන වියදම්** | **533,050,000** | **425,065,278** | **107,984,722** | **80** |
| | එකතුව | **1,145,538,000** | **963,311,676** | **182,226,324** | **84** |
| 3 | **රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුම** | 25,605,000 | 23,751,759 | 1,853,241 | 93 |
| | මුළු එකතුව | **1,171,143,000** | **987,063,436** | **184,079,564** | **84** |

**(මූලාශ්‍රය: ගිණුම් අංශය- විදේශ රැකියා අමාත්‍යාංශය)**

### 1. පුනරාවර්තන වියදම්

පුද්ගල පඩිනඩි, දේශීය හා විදේශීය ගමන් වියදම් සහ ලිපි ද්‍රව්‍ය අවශ්‍යතා සඳහා පුනරාවර්තන වියදම් දරා ඇත. අමාත්‍යතුමියගේ කාර්ය මණ්ඩලය ඇතුළුව අමාත්‍යාංශයේ නිලධාරීන් 158ක් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්තව සංවර්ධන නිලධාරීන් 942 දෙනෙකුගෙන් කාර්ය මණ්ඩලය සමන්විතය.

## 2. මූලධන වියදම්

කාර්ය මණ්ඩලයේ භාවිතයට පරිගණක මිලදී ගැනීම් හා කාර්යාලීය ගෘහ භාණ්ඩ මිලදී ගැනීම් සඳහා මෙම මූලධන වියදම් දරා ඇත.එසේම පුහුණුව සඳහා දරන ලද වියදම් මූලධන වියදම් යටතට ඇතුළත් වේ.

## 3. වෙනත් මූලධන වියදම්

භාණ්ඩාගාරයෙන්ලැබුණු රු මිලියන 175 රාජ්‍ය ආයතන වෙත මාරුකර යැවීම් ලෙස ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත මාරු කර යවන ලදී. එසේම රත්නපුර හාභාලිඇල විගමනික සම්පත් මධ්‍යස්ථානඉදි කිරිමේ කටයුතු සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් දරන ලද රු මිලියන 233.9ක මුදල කාර්යාංශය වෙත ප්‍රතිපූර්ණය කරන ලදී. රු.මිලියන 5.48ක මුදලක් කාර්යාලීය ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා වැය කර ඇත.

## 4. රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුම

උත්සව අත්තිකාරම් අයදුම් කළ නිලධාරීන්ට සහ ආපදා ණය අයදුම්කල නිලධාරීන් සඳහා , අයදුම් කල අනුපිළිවෙලට භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම අනුව රු මිලියන 23.75ක අත්තිකාරම් ලබා දෙන ලදී.

## 2. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

### 2.1.උපාය මාර්ගික දිශානතිය

### දැක්ම

"එතෙර වෙළඳපොළ සඳහා නිපුණතාවයෙන් පිරි මිනිස් සම්පත සැපයීමේ ලොව හොඳම තේරීම බවට ශ්‍රී ලංකාව පත්වීම"

### මෙහෙවර

"දේශීය ආර්ථිකයට දායක වෙමින් හා සියළුම පාර්ශවකරුවන්ගේ යහපත සුරක්ෂිත කරමින්, ජනතාවට තම කුසලතාවයන්ගෙන් එතෙර රැකියා වෙළඳපොළෙහි යහපත් ප්‍රතිලාභ ලැබිය හැකි කාර්යක්ෂම හා සමානත්වයෙන් යුතු මාර්ගයන් බිහි කිරීම"

### 2.2. කාර්යාංශයේ අරමුණු හා ප්‍රතිපත්ති

විදේශ සේවා නියුක්ති කාර්යාංශය ලඟාකරගැනීමට බලාපොරොත්තුවන අරමුණු ශ්‍රම බලකාය ඔවුන්ගේ වගකීම් කාර්යාංශමව හා ඵලදායීව ඉටුකළ යුතුවේ.

කෙසේ නමුත් ජාතික විගමනික කම්කරු ප්‍රතිපත්තියට හා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පනතට අනුව එහි වැඩ ප්‍රමාණය ආයතනයේ නිළධාරී මණ්ඩලයේ වැඩිමනක් සමඟ සේවක කළමනාකරණයෙහි වර්තමාන තත්වය පිළිබඳ නිපුනත්වයක් කළමනාකරුවන්ට හා විධායක නිළධාරින්ට තිබේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි ප්‍රධාන අරමුණු පහත සඳහන් පරිදි සාරාංශගත කර දැක්විය හැකිය.

- ශ්‍රී ලාංකිකයන් සඳහා එතෙර රැකියා අවස්ථා නංවාලීම හා සංවර්ධනය කිරීම.
- බලපත්‍රලාභී නියෝජිත ආයතනවල කටයුතු නියාමනය කිරීම හා ඒවාට පහසුකම් සැපයීම.
- විගමනික ශ්‍රමිකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් වෙත ආරක්ෂාව හා සුබසාධනය සැලසීම.

ජාතික විගමණික ප්‍රතිපත්තිය මූලික වශයෙන් අරමුණු 03ක් අවධාරණයෙන් සළකා බලනු ලැබේ.

- විගමනික ක්‍රියාවලියේදී යහපාලනය ප්‍රගුණ කිරිම.
- විගමනික පවුල්වල ආරක්ෂාව හා බලගැන්වීම සඳහා කටයුතු කිරීම.
- විගමනය රටේ සංවර්ධන ක්‍රියාවලිය සමඟ සම්බන්ධ කිරීම.

## 3.ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන විෂය පථය හා කාර්යයන් 2015 (ජනවාරි - දෙසැම්බර්)

1. ශ්‍රී ලාංකිකයන් එතෙර රැකියාවලට බඳවා ගැනීම පිණිස විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
2. දේශීය නියෝජිත ආයතන වෙත විදේශ රටවලින් ලැබෙන රැකියා ඇණවුම් සඳහා අනුමැතිය ලබා දීම.
3. පුද්ගලයන් බඳවා ගැනීම වෙනුවෙන් විද්‍යුත් හා විද්‍යුත් නොවන මාධ්‍ය මගින් සිදු කෙරෙන ප්‍රවර්ධන කටයුතු සඳහා ප්‍රචාරක දැන්වීම්වලට අනුමැතිය ලබා දීම.
4. ශ්‍රී ලංකාවෙන් නික්ම යාමට පෙර විගමනික ශ්‍රමිකයන් කාර්යාංශයේ ලියාපදිංචි කිරීම.

5. දේශීය නියෝජිත ආයතන, විදේශීය රැකියා නියෝජිත ආයතන හා ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කම්කරු අංශය යන පාර්ශ්වයන්ගේ සහයෝගය ඇතිව, විගමනික ශ්‍රමිකයන්ගේ ආරවුල් විසඳීමට ක්‍රියාකිරීම හා එතෙරදී අවශ්‍ය සුබසාධන කටයුතු සැලසීම.
6. විගමනික ශ්‍රමිකයන්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට ආරක්ෂාව හා සුබසාධනය සැලසීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
7. ශ්‍රී ලාංකිකයන් සඳහා එතෙර රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම.
8. විවිධ වැඩසටහන් හරහා එතෙර රැකියා සඳහා යාමට අපේක්ෂා කරන ශ්‍රමිකයින්ට සහාය වීම.

## 3.1. යහපාලනය හා කර්මාන්තය නියාමනය කිරීම

### විදේශ රැකියා නියෝජිත ආයතන ලියාපදිංචි කිරීම

- විදේශ සේවා නියුක්ති නියෝජිත ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීම
  - ➢ නිකුත් කරන ලද නව බලපත්‍ර සංඛ්‍යාව

| | |
|---|---|
| පළමු කාර්තුව | 35 |
| දෙවන කාර්තුව | 33 |
| තෙවන කාර්තුව | 30 |
| හතරවන කාර්තුව | 18 |
| එකතුව | **116** |

| **හතරවන කාර්තුව** | 195 | 402 | 2,160 | 201 | 351 | 2,125 |
| **එකතුව** | **717** | **1,613** | **9,208** | **666** | **1,356** | **8,584** |

**වගුව 74** **(මූලාශ්‍රය:වි.ස I,වි.ස. II,සමථ අංශය, ශ්‍රී.ලං.වි.සේ.නි.කා.)**

## පවුල් පසුබිම් වාර්තාව

ගෘහස්ථ රැකියා සඳහා විදේශ ගත වන කාන්තාවන්ගේ පවුල් පසුබිම් වාර්තාව ලබා ගැනීම 2013.06.07 දින සිට අනිවාර්ය කර ඇත. ඒ අනුව ඔවුන්ගේ විවාහක අවිවාහක භාවය, දරුවන්ගේ මව නොමැතිවිට භාරකාරිත්වය පිළිබඳ ග්‍රාම නිලධාරී සහතික කර විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් මගින් එය සහතික කරනු ලැබේ.

මීට අමතරව පවුල් පසුබිම් වාර්තාවේ නිරවද්‍යතාව තහවුරු කර ගැනීම සඳහා සංවර්ධන නිලධාරීන්ගේ කෙටි පණිවිඩ සේවාව (SMS) මගින් යොමු කරනු ලබන පරිගණක ගත කිරීම 2014.02.26 දින සිට අනිවාර්ය කර ඇත.

මෙම වැඩපිළිවෙලට සුදුසු සේවකයින්ට පමණක් විදේශ ගතවීමට අවසර ලැබෙන බැවින් එය සමාජ පිරිවැය සේම විදේශ ගතවීමෙන් පසු රැකියා ගිවිසුම් කාලය සම්පූර්ණ වීමට නැවත ගෙන්වා ගැනීම ආදිය අඩු කර ගැනීමට උපකාරී වේ.

- පවුල් පසුබිම් වාර්තා නිකුත් කර ඇති ප්‍රමාණය

| | **පළමු කාර්තුව** | **දෙවන කාර්තුව** | **තෙවන කාර්තුව** | **හතරවන කාර්තුව** | **එකතුව** |
|---|---|---|---|---|---|
| අනුමත කළ වාර්තා | 17,425 | 17,833 | 17,034 | 17,201 | 69,493 |
| අනුමත නොකළ වාර්තා | 447 | 441 | 457 | 489 | 1,844 |

**වගුව 75** **(මූලාශ්‍රය: තොරතුරු තාක්ෂණ අංශය-ශ්‍රී.ලං.වි.සේ.නි.කා.)**

## ගෘහස්ථ සේවකයින් සඳහා අවම වයස් සීමාව

ගෘහසේවිකාවන් විදෙස් ගතවීම සඳහා අවම වයස් සීමාවන් පහත සඳහන් පරිදි වේ.

| රට | **අවම වයස් සීමාව** |
|---|---|
| සෞදි අරාබිය | 25 |
| අනෙකුත් මැදපෙරදිග රටවල් | 23 |
| සිංගප්පූරුව,හොංකොං,මැලේසියාව,සයිප්‍රස් සහ අනෙකුත් මැදපෙරදිග රටවල් | 21 |

**වගුව 76** **(මූලාශ්‍රය: ශ්‍රී.ලං.වි.සේ.නි.කා.)**

## 3.3.4. විදේශ රැකියා ප්‍රවර්ධනය සඳහා කලාපීය සහයෝගීතාවය

### කොළඹ ක්‍රියාදාමය

කොළඹ ක්‍රියායනය 2013 වසරේදී කොළඹදී ස්ථාපිත කරනු ලැබූ අතර එහි පළමු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම සාමාජික රටවල් දහයක (10) සහභාගිත්වයෙන් කොළඹදී පවත්වනු ලැබීය. එම සාමජික රටවල් දහය වූයේ බංගලාදේශය, චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, නේපාලය, පාකිස්තානය, පිලිපීනය, ශ්‍රී ලංකාව, තායිලන්තය සහ වියට්නාමය වේ.

වසර දෙකක කාලසීමාවක් සඳහා 2013 ඔක්තෝබර් මාසයේදී කොළඹ ක්‍රියායනය සභාපතිධූරය සඳහා ශ්‍රී ලංකාව තෝරා පත් කර ගත් අතර ඒ අනුව කොළඹ ක්‍රියායනයේ වත්මන් සභාපති වනුයේ විදේශ රැකියා අමාත්‍යතුමියයි. කොළඹ ක්‍රියායනයේ සාමාජික රටවල් විසින් හඳුනාගත් තේමාත්මක ක්ෂේත්‍ර සඳහා ක්‍රියාවට නැංවීම පිණිස උපාය මාර්ගික සැලැස්මක් සහ මාර්ග සිතියමක් පිළියෙල කරන ලදී.

මේ වන විට කොළඹ ක්‍රියායනය ආසියාවේ ශ්‍රම විගමනික සම්භව රටවල් එකොළහක් (11) සඳහා සංවාද වේදිකාවක් බවට පත් ව තිබේ. එම රටවල් එකොළහ වනුයේ ඇෆ්ගනිස්ථානය, බංගලාදේශය, චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, නේපාලය, පාකිස්තානය, පිලිපීනය, ශ්‍රී ලංකාව, තායිලන්තය සහ වියට්නාමයයි. කොළඹ ක්‍රියායනයේ ප්‍රකාශිත ඉලක්කය වනුයේ ශ්‍රම විගමනයේ ප්‍රතිලාභ උපරිම තලයකට ගෙන ඒම පිණිස කතිකාවක නියැලීම පිණිස බැඳීම් රහිත සහ අවිධිමත් පරිසරයක් සාමාජික රටවලට සැපයීම සහ ගිවිසුම්ගත ශ්‍රම විගමනය ආශ්‍රිත ගැටළු පිළිබඳව සහයෝගයෙන් කටයුතු කිරීමයි. මෙම රටවල් සියල්ලම, තම පෞද්ගලික අනන්‍යතාවය පවත්වා ගන්නා අතරම, සම්භව රටවල මෙන්ම බහුතරයක් මැද පෙරදිග පිහිටා ඇති ගමනාන්ත රටවලදී විගමනික චක්‍රය අතරතුර මුහුණපාන්නා වූ පොදු ගැටළු සම්බන්ධයෙන් එක්ව කටයුතු කිරීමට අදහස් කරයි.

මෙම උපාය මාර්ගික දැක්ම අනුව කටයුතු කිරීම පිණිස, පහත දැක්වෙන තේමාත්මක ක්ෂේත්‍ර හඳුනා ගෙන තිබේ.

- සුදුසුකම් සහ පිලිගැනීමේ ක්‍රියාදාම සමාලෝචනය කිරීම
- වඩා ලාභදායී, වඩා වේගවත් සහ වඩා ආරක්ෂිත ප්‍රේෂණ පැවරුම් ප්‍රවර්ධනය
- ආචාර ධර්ම අනුව සේවක බඳවා ගැනීම, පොදු වැටුප් වට්ටම් සහ රක්ෂණ ආරක්ෂණ අභිවර්ධනය කිරීම, ගිවිසුම් ආදේශනය පිළිබඳ ගැටළු පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් සම්මත රැකියා ගිවිසුම් ප්‍රවර්ධනය කිරීම සහ ගිවිසුම් සඳහා ලියාපදිංචි කිරීමේ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම.
- කුසලතා සංවර්ධනය ඇතුළුව ඵලදායී පූර්ව පිටත්වීම් අනුස්ථාපනය සහ බලගැන්වීම සහතික කිරීම
- බහුතරයක් මැද පෙරදිග රටවල පිහිටා ඇති ගමනාන්ත රටවල ආර්ථික ප්‍රවණතා දත්ත පද්ධතියක් වර්ධනය කිරීම.

ඉහත කී තේමාත්මක ක්ෂේත්‍රයන්හි අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අදහස ඇතිව, කොළඹ ක්‍රියායනයේ සාමාජික රටවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීමේ තුනක් කොළඹදී පවත්වන ලදී. පළමු ජ්‍යෙෂ්ඨ නිලධාරී රැස්වීම 2014 මැයි මස 6 සහ 7 දිනයන්හි කොළඹදී පවත්වනු ලැබීය. එහි දෙවැනි 2014 ඔක්තෝබර් 14 වන දින කොළඹදී පවත්වනු ලැබූ අතර තුන්වන රැස්වීම 2015 නොවැම්බර් මස 4 සහ 5 යන දෙදින තුල කොළඹදී පැවැත්විණි. මේ සඳහා සාමාජික රටවල් සියල්ල සහභාගීවෙමින් සාමාජික රටවල විගමනික සේවකයන්ගේ අයිතිවාසිකම් හා සුබසාධනය ප්‍රවර්ධනය කිරීමේ සංදර්භය තුළ තේමාත්මක ක්ෂේත්‍ර සාකච්ඡාවට බඳුන් කළ අතර එහිදී නිර්දේශ මාලාවක් සඳහා එකඟ වන ලදී. මෙම නිර්දේශ අවසන් ප්‍රකාශනයක ස්වරූපයෙන් අන්තර්ගත කරනු ලැබූ අතර 2015 නොවැම්බර් මස 4 සහ 5 දෙදින තුලදී කොළඹදී පැවැත්වූ කොළඹ ක්‍රියායනයේ යෝජිත ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්විමට ඉදිරිපත් කල අතර එම නිර්දේශ සහ ආශ්‍රිත නිරීක්ෂණ තනි තනිව සහ / හෝ සාමූහිකව පසු විපරම් ක්‍රියාමාර්ග සඳහා සාමාජික රටවල් අතර සංසරණය කරනු ලැබීය.




**2015 නොවැම්බර් 4 සහ 5 දිනවලදී පැවැත්වූ කොළඹ ක්‍රියාදාමයේ සාමාජික රටවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම**

## 3.3.5.විශේෂ ජයග්‍රහණ

### කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණය (EPS –TOPIK) විශිෂ්ඨව පැවැත්වීම වෙනුවෙන් දකුණු කොරියාවෙන් ලද විශිෂ්ඨතා සම්මානය

දශකයකට වඩා වැඩි කාලයක සිට ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් දකුණු කොරියානු රාජ්‍යය වෙත රැකියා සඳහා යවනු ලබයි.

2004 වර්ෂයේදී දෙරට අතර ඇති කර අවබෝධතා ගිවිසුම ප්‍රකාරව රැකියා බලපත්‍ර ක්‍රමය **(EPS)** ක්‍රියාත්මක කිරීමෙන් පසු කොරියානු රාජ්‍ය වෙත ඉතා ගුණාත්මක බවින් ඉහළ සේවක පිරිසක් යැවීම සඳහා කොරියානු භාෂා විභාගය නිවැරදිව පැවත්වීම,මනා පුහුණුව වැනි අවශ්‍ය පියවරයන් ගනිමින් පවතී.

රැකියා බලපත්‍ර ක්‍රමයේ විනිවිද භාවය වැඩි දියුණු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජයේ සම්බන්ධීකරණයෙන් ඉහත අවබෝධතා ගිවිසුම සෑම වසර දෙකකට වරක්ම අළුත් කිරීම දකුණු කොරියානු රාජ්‍යය විසින් සිදු කරනු ලබයි.

දකුණු කොරියානු රජය විසින් 2015 වර්ෂයේදී කොරියානු භාෂා විභාගය ( 13 වන **EPS-TOPIK**) පැවැත්වීමේ හොඳම රට ලෙස ශ්‍රී ලංකාව නම් කරනු ලැබ ඇති අතර ඒ අනුව විශිෂ්ඨතා සම්මානයෙන් පිදුම් ලැබීම සඳහා ශ්‍රී ලංකාව තෝරා ගනු ලැබ ඇත්තේ, “සේවකයින් යැවීමේ හොඳම රට” යන මැයෙන් රටවල් 15 ක සහභාගීත්වයෙන් පවත්වනු ලැබූ තරඟයකිනි.

## 3.3.6.කාර්යාංශයේ අනාගත සැළසුම්

### විගමනික සම්පත් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම

පිහිටුවීමට යෝජිත විගමණික සම්පත් මධ්‍යස්ථාන 08 ක් ද, කතරගම සංචාරක බංගලාව ඉදිකිරීමද, මතුගම විගමණික සම්පත් මධ්‍යස්ථානයේ ඉතිරි ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

### විගමණික සම්පත් මධ්‍යස්ථානය - හෝමාගම

යෝජිත ඉඩම කාර්යාංශය වෙත අත්පත් කර ගැනීම සඳහා අයිතිය නිරවුල් කර ගැනීමේ නීතිමය තත්ත්වය පිළිබඳව පැහැදිලි කරගැනීම් නීති අංශයෙන් සිදුකරගෙන යනු ලබයි. ඉඩම සඳහා ඇස්තමේන්තු වටිනාකම රුපියල් මිලියන 52ක් වන අතර, එයින් රුපියල් මිලියන 26 ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා ඇත. ඉතිරි මුදල වන රුපියල් මිලියන 26 ගෙවන ලෙසට නාගරික සංවර්ධන අධිකාරිය දන්වා ඇත.

යෝජිත ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය හරහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් අත්පත් කරගෙන ඇත. ඉඩමේ ඇස්තමේන්තුගත මුළු වටිනාකමෙන් 50% ක් ගෙවා එය පවරාගෙන ඇති අතර ඒ සඳහා අධිකාරිය යටතේ සංවර්ධන කටයුතු සිදුකර ඇත.

## විගමණික සම්පත් මධ්‍යස්ථානය - රත්නපුර

මෙම මධ්‍යස්ථානය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ලින්ක් ඉංජිනියරින් පුද්ගලික සමාගම වෙත 2014/07/16 දින පිරිනමන ලදී. මෙම මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා 2014/08/21දින මුල්ගල තබන ලදී. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අදාල සමාගම විසින් සාර්ථකව සිදු කරමින් සිටී.

## විගමණික සම්පත් මධ්‍යස්ථානය - හාලිඇල

මෙම මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2014.10.29දින ආර්. එන් කන්ස්ට්‍රක්ෂන් පුද්ගලික සමාගම වෙත පිරිනමා ඇත. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 2014.11.13 දින ආරම්භ කර ඇත. ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතින අතර 2016 අප්‍රියෙල් මසදී වැඩ අවසන් කිරීමට නියමිතව ඇත.

## විගමණික සම්පත් මධ්‍යස්ථානය - කුරුණෑගල

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට "මහුරුඔය"තුළ පිහිටි රජයට අයත් ඉඩම් පැවරීම සඳහා ඉඩම් අමාත්‍යාංශය එකඟ වී ඇත. යෝජිත ඉඩම් ලබා ගැනීමට අවශ්‍ය පියවර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාශයේ නීති අංශය විසින් ඉටුකරගෙන යනු ලබයි. තාක්ෂණ ඇගයීම් කමිටු මඟින් ඉදිකිරීම් සඳහා උපදේශන ආයතනයක් නිර්දේශ කර අමාත්‍යාංශය වෙත ලබා දී ඇත. තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශ සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා ගැනීමට නියමිතව ඇත.

## සංචාරක බංගලාව - කතරගම

මෙම සංචාරක බංගලාව ඉදිකිරීම සඳහා උපදේශන ආයතනය ලෙස රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව කටයුතු කරනු ලබයි. ඉදිකිරීම් ආරම්භ කිරීමට සැලසුම් සහ ටෙන්ඩර් ලියවිලි පිළිබඳ එම ආයතනය සමග සාකච්ඡා කර ඇත. මේ සඳහා තාක්ෂණ ඇගයීම් කමිටු පත් කර ගැනීම සහ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු පත් කර ගැනීමට නියමිතව ඇත.

## විගමණික සම්පත් මධ්‍යස්ථානය - මතුගම(අතිරේක ගොඩනැඟිලි ඉදිකිරීම)

මතුගම විගමණික පුහුණු මධ්‍යස්ථානයේ ගොඩනඟිලි වලින් කොටසක් ඉදිකර 2012.11.24 දින විවෘත කරන ලදී. ඉතිරි අමතර ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා උපදේශන ආයතනය වන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමග අවශ්‍ය සාකච්ඡා 2015.09.30වන දින පවත්වා ඇත. ඉඩමෙහි අයිතිය කාර්යාංශය වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

## විගමණික සම්පත් මධ්‍යස්ථානය - අනුරාධපුර

රජයේ ඉඩම් කොටසක් මේ සඳහා ඉඩම් කොමසාරිස් ජෙනරාල් විසින් අමාත්‍යාංශය වෙත නිදහස් කිරීම අනුමත කර ඇත. උද්ගත වූ අනපේක්ෂිත ගැටළුකාරී තත්වයක් හේතුවෙන් මෙම ඉඩම කාර්යාංශය වෙත අත්පත් කර ගැනීම මඳක් ප්‍රමාද කිරීමට සිදු වී ඇති අතර කාර්යාංශයේ නීති අංශය මගින් ඒ සඳහා අවශ්‍ය කටයුතු තාවකාලිකව නතරකොට ඇත.

## විගමණික සම්පත් මධ්‍යස්ථානය - ත්‍රිකුණාමලය

සුමේධංකරපුර හෝ ශ්‍රද්ධාපුර ප්‍රදේශයේ ඉඩම් අක්කර 2ක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් රජයට නිදහස් කිරීමෙන් අනතුරුව කාර්යාංශයට ලබා දීමට කටයුතු සිදු කරන බව ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී ඇත.
විදේශ රැකියා අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් මෙම ඉඩම කාර්යාංශය වෙත අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනමින් සිදු වෙමින් පවතී.

## හෝටල් පාසල - කටුනායක

කාර්යාංශය හා ශ්‍රී ලංකා රතුකුරුස සමාජය හවුල් ව්‍යාපාරයක් ලෙස පිහිටුවීමට යෝජිත හෝටල් පාසල සඳහා රතුකුරුස සමාජයට අයත් කටුනායක පිහිටි අක්කර 5ට වඩා වැඩි ඉඩම් කොටසක් සහ එහි කොටසක් නිමකල ගොඩනැගිල්ල වසර 99 බදු පදනම මත ලබාගැනීමට අදහස් කර ඇත.මෙම ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු සිදු වෙමින් පවති.
තවද මීට අමකරව කාර්යාංශයේ ඉදිකිරීම් කටයුතු සඳහා සුදුසු ඉඩම් කැබලි කිහිපයක් මාකුඹුර, පොළොන්නරුව, මඩකලපුව හා වවුනියාව යන ප්‍රදේශ වලින්ද අත්පත් කර ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතී.

## 3.3.7.මූල්‍ය කාර්ය සාධනය

### 2015.01.01 – 2015.12.31 දක්වා ආදායම් වියදම් සාරාංශය

| *විස්තරය*<br>ආදායම | *සත්‍ය*<br>*2015.10.01සිට 2015.12.31 දක්වා (රු.)* | *අයවැය*<br>*2015.10.01සිට 2015.12.31 දක්වා (රු.)* | *අයවැය ළගාකර ගැනීම % ලෙස* |
|---|---|---|---|
| බදවා ගැනීමේ ගාස්තු/නියෝජිත ආයතන | 97,103,250 | 132,500,000 | 73.29 |
| බදවා ගැනීමේ ගාස්තු පුද්ගලික මාර්ගයෙන් /කාර්යාංශය | 211,109,000 | 131,250,000 | 160.84 |
| පහසුකම් ගාස්තු | 15,861,000 | 14,500,000 | 109.39 |
| බලපත්‍ර ගාස්තු | 13,900,000 | 15,250,000 | 91.15 |
| සෙස් ආදායම | 65,144,761 | 93,750,000 | 69.49 |
| කොරියානු නැවත බදවා ගැනීමේ වැඩසටහනට අදාල ගාස්තු | 21,666,547 | 26,000,000 | 83.33 |
| පුහුණු කිරීමේ ගාස්තු | 33,430,185 | 77,500,000 | 43.14 |
| ගුවන් ප්‍රවේශපත් ඒකකය වෙත ලැබුණු කොමිස් මුදල් | 651,119 | 2,000,000 | 32.56 |
| සේවක සුභසාධක අරමුදලේ වියදම් ප්‍රතිපූර්ණය කිරීම | 77,543,926 | 87,500,000 | 88.62 |
| **මෙහෙයුම් ආදායම** | **536,409,788** | **580,250,000** | 92.44 |
| **අඩුකළා** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 232,763,763 | 234,690,000 | 99.18 |
| ආයතනික වියදම් | 79,566,420 | 72,337,500 | 109.99 |
| මෙහෙයුම් වියදම් | 43,380,293 | 67,970,000 | 63.82 |
| වෙළඳ දැන්වීම් හා ප්‍රචාරණවියදම් | 6,473,244 | 30,000,000 | 21.58 |
| ව්‍යාපාර ප්‍රවර්ධන වියදම් | 7,313,869 | 27,500,000 | 26.60 |
| සේවක සුභ සාධන අරමුදල් වියදම් | 198,525,071 | 273,200,000 | 72.67 |
| **මුළු වියදම** | **568,022,660** | **705,697,500** | 80.49 |
| **අතිරික්තය/ඌණතාවය** | **(31,612,872)** | **(125,447,500)** | 25.20 |
| **එකතුකළා/ වෙනත් ආදායම්** | | | |
| ආයෝජන මත පොළිය | 105,492,213 | 84,500,000 | 124.84 |
| කාර්ය මණ්ඩල ණය වලින් පොළිය | 4,128,922 | 2,000,000 | 206.45 |
| විවිධ ආදායම් | 15,508,376 | 50,000,000 | 31.02 |
| **මුළු වෙනත් ආදායම** | **125,129,510** | **136,500,000** | 91.67 |
| **වියදමට වඩා ආදායම් අතිරික්තය** | **93,516,638** | **11,052,500** | 846.11 |
| අඩුකලා (බදු සදහා ප්‍රතිපාදන) | | | |
| එකතුවූ අරමුදල සඳහා ඉදිරියට ගෙනා ශේෂය | **93,516,638** | **11,052,500** | 846.11 |
| අනෙකුත් විස්තීරණ ආදායම් | | | |
| අන්තර්කාලීන විදේශ මෙහෙයුම් හුවමාරුවෙන් ලැබූ වාසි/පාඩු | - | | |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | | |
| විශ්‍රාම සැලසුම් සත්‍ය ලැබීම් හා පාඩු | | | |
| අනෙකුත් විස්තීර්ණ ආදායම | | | |
| **මුළු විස්තීර්ණ ආදායම්** | **93,516,638** | **11,052,500** | - |

**වගුව 77** **(මූලාශ්‍රය: මුදල් අංශය ශ්‍රී.ලං.වි.සේ.නි.කා.)**

## 2014.01.01 – 2014.12.31 දක්වා ආදායම් වියදම් සාරාංශය

| විස්තරය | සත්‍ය 2014.01.01සිට 2014.12.31 දක්වා (රු.) | අයවැය 2014.01.01සිට 2014.12.31 දක්වා (රු.) | අයවැය ළඟාකර ගැනීම් % |
|---|---|---|---|
| **ආදායම** | | | |
| බදවා ගැනීමේ ගාස්තු/නියෝජිත ආයතන | 527,321,250 | 459,258,750 | 115 |
| බදවා ගැනීමේ ගාස්තු පුද්ගලික මාර්ගයෙන් /කාර්යාංශය | 654,174,000 | 699,350,000 | 94 |
| පහසුකම් ගාස්තු | 58,804,400 | 58,350,000 | 101 |
| බලපත්‍ර ගාස්තු | 70,050,000 | 56,750,000 | 123 |
| සෙස් ආදායම | 292,226,077 | 35,000,000 | 835 |
| කොරියානු පරිපාලන ගාස්තු | - | - | |
| කොරියානු නැවත බදවා ගැනීමේ වැඩසටහනට අදාල ගාස්තු | 23,975,838 | 36,278,623 | 66 |
| පුහුණු කිරීමේ ගාස්තු | 4,750,132 | 10,000,000 | 48 |
| පුහුණු කිරීමේගාස්තු | 707,232,003 | 1,100,000,000 | 64 |
| ගුවන් ප්‍රවේශපත් ඒකකය වෙත ලැබුණු කොමිස් මුදල් | - | - | |
| සේවක සුභසාධක අරමුදලේ වියදම් ප්‍රතිපූර්ණය කිරීම | 222,541,787 | 426,075,588 | 52 |
| **මෙහෙයුම් ආදායම** | **2,561,075,487** | **2,881,062,961** | 89 |
| **අඩුකළා** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 819,464,418 | 914,940,000 | 90 |
| ආයතනික වියදම් | 293,547,351 | 267,566,000 | 110 |
| මෙහෙයුම් වියදම් | 259,826,613 | 371,610,000 | 70 |
| වෙළඳ දැන්වීම් හා ප්‍රචාරණවියදම් | 201,133,337 | 124,260,000 | 162 |
| ව්‍යාපාර ප්‍රවර්ධන වියදම් | 98,677,993 | 191,050,000 | 52 |
| සේවක සුභ සාධන අරමුදල් වියදම් | 1,372,116,594 | 1,527,930,000 | 90 |
| **මුළු වියදම** | **3,044,766,306** | **3,397,356,000** | 90 |
| **අතිරික්තය/ඌණතාවය** | **(483,690,819)** | **(516,293,039)** | 94 |
| **එකතුකළා/ වෙනත්ආදායම්** | | | |
| ආයෝජන මත පොළිය | 452,523,316 | 450,000,000 | 101 |
| ලොක කම්කරු සංවිධානයෙන් ලැබීම් | | 1,000,000 | |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ආදායම | | 1,000,000 | |
| විදේශ ආධාර ලැබීම් | | 1,000,000 | |
| කාර්ය මණ්ඩල ණයවලින් පොළිය | 13,300,164 | 15,000,000 | 89 |
| විවිධ ආදායම් | 434,439,015 | 113,447,000 | 383 |
| **මුළු වෙනත් ආදායම** | **900,262,495** | **581,447,000** | 155 |
| **වියදමට වඩා ආදායම් අතිරික්තය** | **416,571,676** | **65,153,961** | 639 |
| අඩුකලා (බදු සඳහා ප්‍රතිපාදන) | 116,640,070 | 20,203,109 | 577 |
| එකතුවූ අරමුදල සඳහා ඉදිරියට ගෙනා ශේෂය | **299,931,607** | **44,950,852** | 667 |
| අනෙකුත් විස්තීරණ ආදායම් | | | |
| අන්තර්කාලීන විදේශ මෙහෙයුම් හුවමාරුවෙන් ලැබූ වාසි/පාඩු | 35,520,118 | 7,000,000 | 507 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | | |
| විශ්‍රාම සැලසුම් සත්‍ය ලැබීම් හා පාඩු | 9,638,178 | | |
| අනෙකුත් විස්තීර්ණ ආදායම | | | |
| **මුළු විස්තීර්ණ ආදායම්** | **345,089,904** | **51,950,852** | 664 |

වගුව **78**

**(මූලාශ්‍රය: මුදල් අංශය ශ්‍රී.ලං.වි.සේ.නි.කා.)**

# 4. ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය

## 4.1. හැඳින්වීම

රජයට අයත් එකම විදේශ රැකියා ඒජන්සිය වන ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය විදේශ රැකියා ක්ෂේත්‍රයේ නියාමන ආයතනය වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයීය පරිපාලිත ආයතනයක් වශයෙන් විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ 1996 ඔක්තෝම්බර් මාසයේ සිට ස්ථාපිත ක්‍රියාත්මක ආයතනයකි. 2013 වසරේදී ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගම ISO9001:2008 තත්ව සහතිකයෙන් පිදුම් ලැබීය

මෙම අතුරු වාර්තාව ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගමේ 2015 ජනවාරි 01 සිට 2015 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාලව දළ විශ්ලේෂණයක් ලබා දෙනු ලබයි.

### i. දැක්ම

- විදේශ රැකියා වෙළඳපොළට පුහුණු ශ්‍රමිකයන් සපයන ප්‍රමුඛ පෙලේ සේවා දායකයෙකු වීම.

### ii. මෙහෙවර

- ඒජන්සියේ මූලික අරමුණු හා ක්‍රියාකාරකම් වලට අනුගත අදාල අමාත්‍යාංශ යටතේ ඇති ආයතන සමග සබඳතාවය වර්ධනය කර ගනිමින්, විදේශ රැකියා වෙළඳපොළ ගවේශණයෙන් රැකියා අවස්ථා හඳුනා ගැනීම, ශ්‍රී ලාංකීය තරුණ - තරුණියන් විදේශ රැකියා වෙළඳපොළට ගැලපෙන අයුරින් පුහුණු කිරීම සහ සුරක්ෂිත සේවා තත්වයන් යටතේ රැකියාවට බඳවා ගැනීම.

### iii. අරමුණ

- විදේශ රැකියා ඒජන්සියට අයත් ව්‍යාපාරික කටයුතු 1985 අංක 21 දරණ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පණත යටතේ හෝ වෙනත් කිසියම් ව්‍යවස්ථාපිත නීතියක් හෝ නීති පසුබිමක් යටතේ කලින් කලට බලාත්මක වන නීති වලට අනුකූලව පවත්වාගෙන යාම.
- ශ්‍රී ලංකාව තුළ හෝ විදේශීය වශයෙන් වෘත්තීමය, පරිපාලනමය තාක්ෂණික හා කාර්මික පුහුණු, අර්ධ පුහුණු හෝ නුපුහුණු ගෘහස්ථ සහ හෝටල් සේවකයින්, ගුරුවරුන්, සේවා සපයන්නන් සහ සියලුම වර්ග වලට අයත් සේවකයින් සඳහා රැකියා පිරිනැමීම හෝ සැපයීම.
- මිනිස් බලය සපයන වෙළඳ රක්ෂණ, වාණිජ හෝ කර්මාන්ත වල පුද්ගලයන් ආයතන හා සංවිධාන වල නියෝජිතයකු, බ්‍රෝකර්වරයකු, උපදේශකයකු, විශේෂඥ උපදේශකයකු ලෙස පුද්ගල, ආයතන සංවිධාන ලෙස මෙන්ම එවැනි සේවා සැපයීම සඳහා වන ආයතන සමහ අවබෝධතා ගිවිසුම් වලට ඇතුලත් වීම.
- රැකියා අවශ්‍යතාවයන් සංතෘප්තියට ලක් කිරීම සඳහා දැනට පවත්නා සේවක පිරිසකගේ හැකියාවන් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය හැඩගැන්වීම සහ පුහුණු කිරීම් කර්තව්‍යයන් කළමනාකරණය කිරීම.
- මූලිකවම මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය භාවිතය මගින් දේශීයව හා ජාත්‍යන්තරව පුවත්පත්, ගුවන් විදුලි, රූපවාහිනී නාලිකා, අන්තර්ජාලීය කර්තව්‍යයන් ආදී කටයුතු සඳහා අනුග්‍රහය දැක්වීම.

## 4.2. ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සියේ ප්‍රධාන කාර්යයන්

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සියේ මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් ප්‍රධාන අංශ 05ක් මගින් සිදුවේ.

**i.** **බඳවාගැනීමේ අංශය**
**ii.** **මූල්‍ය අංශය**
**iii.** **පරිපාලන හා මානව සම්පත් අංශය**
**iv.** **තොරතුරු තාක්ෂණ අංශය**
**v.** **විගමනික ශ්‍රමික රක්ෂණ අංශය**

## i. බඳවාගැනීමේ අංශය

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සියේ මුඛ්‍ය පරමාර්ථය ලඟා කරගැනීම සඳහා ව්‍යාපාර ප්‍රවර්ධන හා ප්‍රචාරක අංශය මූලික කර්තව්‍ය සිදු කරන අතර විදේශ රැකියා සඳහා පුද්ගලයින් බඳවා ගැනීමද සිදුකරනු ලබන්නේ මෙම අංශය මගිනි.
මෙම අංශයේ ප්‍රධාන ක්‍රියාදාමයන් වන්නේ,

1. රැකියා ඇණවුම් සොයා ගැනීම.
2. රැකියා ඇණවුම් සඳහා මූලික අනුමැතිය ලබා ගැනීම.
3. රැකියා ඇණවුම් වලට අදාල ප්‍රචාරයන් සඳහා අනුමැතිය ලබා ගැනීම.
4. සුදුසු අයදුම්කරුවන් සොයා ගැනීම.
5. සේවා යෝජකයින්ගේ තෝරා ගැනීම සඳහා අයදුම්පත් යොමු කිරීම සහ ඔවුන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම.
6. සුදුසු අයදුම්කරුවන් තෝරාගැනීම උදෙසා සම්මුඛ පරීක්ෂණ සහ තත්ත්ව පරීක්ෂණ පැවැත්වීම
7. බඳවාගැනීමට අදාලවූ වෛද්‍ය පරීක්ෂණ කටයුතු ,ගිවිසුම් අත්සන් කිරීම , ගුවන් ටිකට්පත් ලබා ගැනීම වැනි කටයුතු ඉටුකිරීම.
8. වීසා ලබාගැනීම සඳහා වූ අදාල ලිපි ලේඛන සකස්කර නියමිත අංශ වෙත යොමු කිරීම.
9. විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් අවසන් අනුමැතිය ලබාගැනීම සහ පුද්ගලයින් රැකියා සඳහා විදේශ ගත කිරීම.

## ii. මූල්‍ය අංශය

ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා මුදල් අංශය මූලික කාර්ය භාරයක් ඉටු කරයි.

1. මුදල් පාලනය
   - මුදල් ලැබීම් සඳහා ලදුපත් නිකුතුව, එම මුදල් බැංකු ගත කිරීම, සැපයුම් කරුවන් හා ගණුදෙනු කරුවන් සඳහා චෙක්පත් නිකුතුව
   - බැංකු සැසඳුම් පිළියෙල කිරීම
   - අතිරික්ත මුදල් උපරිම පොලී අනුපාතයක් ලැබෙන හා සුරක්ෂිත ආයතනවල (වාණිජ බැංකු) ආයෝජනය කිරීම.

2. ගිණුම් පොත් නිසියාකාරව පවත්වාගෙන යාම
3. ලෙජර් ගිණුම් සැසඳුම් පවත්වාගෙන යාම
4. වැටුප් පිළියෙල කිරීම, ගෙවීම.
5. ණය හිමි හා ණය ගැති පාලනය
6. සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාර මුදල් සහ සියලුම බදු මුදල් නිසි දිනට ප්‍රථම අදාල වාර්තාද සමග ගෙවීම.
7 මාසික මූල්‍ය වාර්තා නිසිදිනට පෙර පිළියෙල කිරීම.
8 වාර්ෂික මූල්‍ය වාර්තා නිසි දිනට පෙර පිළියෙල කොට භාරදීම.
9 වෛද්‍ය මධ්‍යස්ථානයේ ලදුපත් නිකුත්කිරීම ආදායම් සැසඳුම් කිරීම හා මුදල් අධීක්ෂණය

## iii.පරිපාලන හා මානව සම්පත් අංශය

පරිපාලන හා මානව සම්පත් අංශය මඟින් ආයතනයේ අරමුණු හා මූලික ක්‍රියාකාරකම් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය සහාය ලබා දෙනු ලබන්නේ පහත පරිදිය.

1 දෛනික ආයතනය පරිපාලන කටයුතු සුපරීක්ෂණය හා අධීක්ෂණය
2 ලිපි ද්‍රව්‍යය තොග පවත්වාගෙන යාම.
3 ලිපි හා සන්නිවේදන කටයුතු පවත්වාගෙන යාම.
4 ආයතනය සතු රථවාහන සහ ප්‍රවාහන කටයුතු මැනවින් පවත්වාගෙන යාම. (ඉන්ධන පරිභෝජනය විධිමත්ව පවත්වාගැනීම හා ප්‍රවාහන කටයුතු)
5 ලිපි ද්‍රව්‍ය මුද්‍රණය කිරීමේ කටයුතු
6 දුරකථන, විදුලිය, ජල, බිල්පත් ආදිය ගෙවීම් කටයුතු ගිණුම් අංශයට ඉදිරිපත් කිරීම.

7 ආයතනය සතු වත්කම් පිළිබඳව ලේඛන යාවත්කාලීන කිරීම (වායු සමීකරණ, පරිගණක, ලී බඩු)
8 සියලුම පහසුකම් සහ යටිතල ව්‍යුහය හැසිරවීම හා ඒ සඳහා අදාල පාර්ශවයන් සමග සම්බන්ධවී කටයුතු කිරීම.
9 ආයතනයේ සියළුම නිවාඩු වාර්තා යාවත්කාලීන කිරීම හා නිවාඩු ඉල්ලුම් පත් හා නිවාඩු වාර්තා සාරාංශගත කිරීම.
10 සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, සේවකයන්ගේ පත්වීම් හා සම්බන්ධව පත්වීමේ ලිපි, මාරු කිරීමේ ලිපි, ස්ථිර කිරීමේ ලිපි සකස් කිරීම.

## iv. තොරතුරු තාක්ෂණ අංශය

ආයතනය සඳහා සහය සේවා සපයන ප්‍රධාන අංශයක් ලෙස තොරතුරු තාක්ෂණ අංශය දැක්විය හැකිය. එම අංශය මගින් ඉටුකෙරෙන ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

1 පරිගණක ජාලගත කිරීම සහ ඒවා පවත්වාගෙන යාම.
2 විද්‍යුත් තැපැල් සේවා හා අන්තර්ජාල සේවා සැපයීම.
3 ආයතන වෙබ් අඩවිය යාවත්කාලීන කටයුතු සහ එහි දත්ත අවශ්‍ය තොරතුරු පද්ධති ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම.
4 රැකියා අයදුම්, සම්පාදන සහ රක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු පද්ධති ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම.
5 සේවාදායක පරිගණක, අනෙකුත් පරිගණක සහ දෘඩාංග නඩත්තුව
6 සියලු ආයතන අංශ වෙත අවශ්‍ය තොරතුරු තාක්ෂණ සහය ලබාදීම.

## v. විගමණික ශ්‍රමික රක්ෂණ අංශය

මෙම අංශයෙහි මූලික අරමුණ වනුයේ එම සේවකයන් හට කාර්යක්ෂම සේවයක් ලබා දීමටත්, ඔවුන්ට දැනට ලැබෙන ප්‍රතිලාභ වලට වැඩිමනත් යහපත් ප්‍රතිලාභයක් ලබා දීමටත්, ඉදිරියේදී මෙම ආයතනය සාර්ථක ලාභ ලබන ආයතනයක් බවට පත් කිරීමත්ය.

මෙම රක්ෂණ අංශයේ මූලික ක්‍රියාකාරකම් ලෙස,

1. විදේශ රැකියා අවස්ථාවන් ලැබූ අයගේ තොරතුරු වාර්තා ගත කොට සුදුසු කටයුතු කිරීම.
2. හිමිකම් නිරාකරණය කිරීම.
3. හිමිකම් තක්සේරු කිරීම.
   - MBSLසමාගම මගින් හිමිකම් තක්සේරු කිරීම.
   - මරණ වන්දි, සම්පූර්ණ හා අර්ධ අකර්මන්‍යතා වන්දි හිමිකම් ආවරණය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලබාගෙන ඇත.
4. හිමිකම පිළිබඳ නිරාකරණය කිරීම.
   - ගෙවීමට අනුමත කල චෙක්පත් විදේශ සේවා නියුක්ති කාර්යංශය වෙත භාරදීම.
   - ප්‍රතික්ෂේප කරන හිමිකම් වෙනුවෙන් අදාළ රක්ෂිතයා දැනුවත් කිරීම.
5. ලිපිගොනු පවත්වාගෙන යෑම හා හිමිකම් නිරාකරණය කිරීම.
6. විදේශ සේවය සඳහා ගොස් එන සියළුම රක්ෂිතයන්ට වෙන වෙනම ප්‍රාරක්ෂණ ලිපි ගොනු නිකුත් කිරීම.
7. විදේශ රක්ෂණ හිමිකම් නිර්ණය අප ආයතනය තුලින් සිදුකිරීම හේතුකොටගෙන ඒ තුලින් ආදායමක් අප ආයතනයට ලබා ගැනීම.


## 4.3. ඉලක්ක කරා ළඟාවීම - ජනවාරි සිට දෙසැම්බර් 2015

### i බඳවාගැනීමේ අංශය

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සියේ මූලික පරමාර්ථය විදේශ රටවල් සඳහා ශ්‍රී ලාංකිකයන් බඳවාගැනීමයි. පහත දැක්වෙන්නේ 2015.01.01සිට 2015.12.31 දක්වා කාල පරිච්ඡේදය තුළ ලඟා කරගත් ප්‍රගතියයි.

| රට | 1වන කාර්තුව | | | 2 වන කාර්තුව | | | 3 වන කාර්තුව | | | 4 වන කාර්තුව | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ජන | පෙබ | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ | |
| සයිප්‍රස් | 13 | 05 | 13 | 11 | 13 | 18 | 18 | 10 | 17 | 21 | 10 | 06 | **155** |
| දෝහා කටාර් | 01 | 08 | | | | | 06 | | 19 | 07 | 18 | 07 | **66** |
| ලෙබනන් | 05 | | 12 | | 01 | 01 | 01 | | 01 | | 01 | | **22** |
| ඩුබායි | | 04 | 08 | 03 | | | | | | | | | **15** |
| කුවේට් | 01 | | 01 | | | | | | | | | | **02** |
| සිංගප්පූරුව | 02 | | 01 | | | | | | | | | | **03** |
| සීෂේල්ස් | 07 | 07 | 02 | | | | | | | | | | **16** |
| සෞදි අරාබිය | 01 | | 01 | 02 | | | | | 01 | 02 | 05 | 04 | **16** |
| සාජා | | | | | 08 | 01 | | | | | | 01 | **10** |
| ඊශ්‍රායෙලය | | | | | | | | | | | 23 | 57 | **80** |
| එකතුව | **30** | **24** | **38** | **16** | **22** | **20** | **25** | **10** | **38** | **30** | **57** | **75** | **385** |
| | **92** | | | **58** | | | **73** | | | **162** | | | |

### 2015- ජනවාරි සිට දෙසැම්බර් දක්වා විදේශ ගත ශ්‍රමිකයන්(කාර්තු වශයෙන්)




ඉහත කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් 385 දෙනෙකු වෙනුවෙන් රැකියා ලබාදීමට ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සියට හැකිවී තිබේ. ISO 9001:2008 තත්ත්ව සහතික ලබාගැනීමේදී මෙම අංශය මගින් අත්පොත් සකස් කිරීම හා ක්‍රියාපටිපාටිය විධිමත් කිරීමට දායකවී ඇත.

මෙම වකවානුව තුළ ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සියට බොහෝ රැකියා ඇනවුම් **<u>සුරක්ෂණය</u>** කර ගැනීමට හැකි විය. ඉන් ප්‍රධාන සේවායෝජකයින් කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| 01. යුනයිටඩ් රෙඩිමික්ස් - දෝහා කටාර් | බරවාහන රියදුරු,සැහැල්ලු වාහන රියදුරු,ෂවල් ක්‍රියාකරු, කොන්ක්‍රිට් පම්ප් ක්‍රියාකරු, ඩීසල් කාර්මික, සහායක ඩීසල් කාර්මික, අත් උදව්කරුවන්, බැච්න් ප්ලාන්ට් මිකැනික් |
| 02. අල් ජබර් ඉංජිනියරින් - දෝහා කටාර් | වාහන වායුසමීකරණ ශිල්පීන්, වාහන විදුලි කාර්මික, බරවාහන කාර්මික, ෆෝමන්වරු, වැඩමූලික, පේන්ටර්, අධීක්ෂකවරු |
| 03. අල්කෝ ග්‍රූප් - දෝහා කටාර් | සැහැල්ලු වාහන රියදුරු, බරවාහන රියදුරු, පෙදරේරු,ස්ටීල් ෆික්සර්,විදුලි කාර්මික, පයිප් ෆිටර් බරවාහන සහ සැහැල්ලු වාහන ජොයින්ටර්, කම්කරු සිවිල් ඉංජිනේරු,සිවිල් ෆෝමන්,ප්‍රමාණ සමීක්ෂක, එක්ස්කැවේටර්,ආරක්ෂක නිලධාරීන් |
| 04. අල් නඩී ජුවලරි - සෞදි අරාබිය | මොඩල් මාර්ක් ගෝල්ඩ්, රියදුරන් |
| 05. අල් බටීල් සීකුවර් - දෝහා කටාර් | ආරක්ෂක නිලධාරීන් කාන්තා සහ පිරිමි, අධීක්ෂක ආරක්ෂක නිලධාරීන්, මුදල් අයකැමිවරු, සැහැල්ලු වාහන රියදුරු |
| 06. සසීබ් මෝල්ඩ් - සෞදි අරාබිය | සී එන් සී මිලින්, ලේත් ඔපරේටර්, ඊ ඩී ඩබ් වයර් කට් ඔපරේටර් |
| 07. රෙඩිමික්ස් - දෝහා කාටාර් | බරවාහන රියදුරු, පොම්ප ක්‍රියාකරු, වාහන විදුලි කාර්මික, බරවාහන සහ සැහැල්ලු වාහන කාර්මික |
| 08. නැනෝ සමාගම - සෞදි අරාබිය | සැහැල්ලු වාහන රියදුරු, කම්කරු |
| 09. ඇන්කර් එලයිට් - ඩුබායි | ගණකාධිකාරීවරුන් , කම්කරුවන් |
| 10. ෆීනික්ස් ඉන්ටර්නැෂනල් - දෝහා කටාර් | කැම්ප් බොස්, විදුලි කාර්මික, කාර්මික ශිල්පීන් |
| 11. යුනිසෙෆ් ෆයර් ප්‍රොටෙක්ෂන් - දෝහා කටාර් | ඉංජිනේරුවරු, කාර්මික ශිල්පීන්, අධීක්ෂකවරු, රියදුරු, කාර්මික ශිල්පීන්, පයිප්ප වැද්දුම්කරු, සහායකවරු, සැලසුම් ශිල්පීන් |
| 12. අල්බා ටවර් ඇලුමිනියම් ෆැක්ටරි | උදව්කරුවන්, වඩු කාර්මික, ඇලුමිනියම් වැද්දුම්කරු, වානේ සාදන්නෝ |
| 13. ඉන්දියන් ඕෂන් ටූනා, සීෂෙල්ස් | ඇමෝනියා බලාගාර තාක්ෂණික, වැද්දුම්කරු, නල වැද්දුම්කරු, විද්‍යුත් යාන්ත්‍රික ශිල්පී, කර්මාන්ත ශාලාසේවක, මාළු පිරිසිදු කරන්නියන් |
| 14. කේ පී එම්ප්ලෝයිමන්ට් - සයිප්‍රස් | ගෘහ පාලිකා |
| 15. ප්‍රයිවෙට් එම්ප්ලෝයිමන්ට් - සයිප්‍රස් | ගෘහ පාලිකා |

## ii. මූල්‍ය අංශය

**ඉලක්ක සපුරා ගැනීම**

1 විමර්ෂනයට ලක් කරන ලද කාලය තුළ රු. මිලියන 1.1 කොරියානු තැන්පතු ආපසු ගෙවන ලදී කොරියානු තැන්පතුවල වර්තමාන ශේෂය රු. මිලියන 17.2 (එහි මුල් ශේෂය මිලියන 41.2 විය.) අප සමාගමෙන් ඉල්ලීම් කරන ලද පොරොත්තු ලේඛණයේ සිටි සියලුම ඉල්ලුම් කරුවන් හට ගෙවීම් සිදු කරන ලද අතර ඉතිරි තැන්පත්කරුවන් ඉල්ලීම් ඉදිරිපත් කරන මාසය තුලදීම ගෙවීම් සිදුකරගෙන යනු ලබයි.

2 වර්ෂ 2002 සිට වර්ෂ 2009 දක්වා වැට් සහ ආදායම් බදු නිසි ලෙස ආයතනය මගින් නොගෙවා තිබූ අතර එහි වගකීම රු. මිලියන 42.5 වී තිබුණි. ආදායම් බදු දෙපාර්තමේන්තුව හා බදු තක්සේරු කරුවන් විසින් මුල්‍ය අංශයෙන් විමසන ලද සැසදුම් මුල්‍ය අංශය විසින් නිසි කලට ඉදිරිපත් කිරීම තුලින් දඩ මුදල් සම්පූර්ණයෙන්ම ඉවත්කර බදු වගකීම රු. මිලියන 12.9 දක්වා අඩුකරගත හැකි වූ අතර එය සම්පූර්ණයෙන්ම ගෙවන ලදී.

3 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් ලබා ගත් රු මිලියන 20 වූ ණය මුදල රු මිලියන 8 ගෙවා නිම කරන ලදී.

4 මුල්‍ය අංශය මගින් පරිසණක ගත කරන ලද ලදුපත් නිකුත් කිරීම කරන ලදී.

5 අදාල කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය කොරියානු වෛද්‍ය වාර්තා ලබා ගැනීම ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සියේ ඉන්සි ලැබ් ආයතනයට යොමුකරන ලද අතර ඒ තුලින් මිලියන 10 ක ආදායමක් ලබා ගැනීම.

## iii. පරිපාලන හා මානව සම්පත් අංශය

මානව සම්පත් කළමනාකරණ හා පරිපාලන අංශය ඉහත කාල වකවානුව තුලදී පහත දක්වා ඇති කාර්යයන්හි ප්‍රගතියක් පෙන්නුම්කර ඇත.

**01. ඉහළ කළමනාකරණය මගින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීම :-**


a. ආයතනයේ දත්ත බැංකුවෙහි ලියාපදිංචි වන සියලුම අයදුම්කරුවන්ගෙන් රු.100/- ක ලියාපදිංචි ගාස්තුවක් අයකර ගැනීම.
b. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් නම් කරන ලද සියලුම අයදුම්කරුවන්ගේ වෛද්‍ය පරීක්ෂණ ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සියට අයත් වෛද්‍ය මධ්‍යස්ථානයට යොමුකිරීම. (කොරියානු සහ අනෙකුත් රටවල්)

## iv. තොරතුරු තාක්ෂණ අංශය

උපකාරක සේවා දෙපාර්තමේන්තුවක් වශයෙන් තොරතුරු තාක්ෂණ අංශය පහත සඳහන් ඉලක්ක ජනවාරි සිට දෙසැම්බර් මස දක්වා කාලය තුලදී සපුරා ඇත.

1 විදේශ රැකියා නියෝජිතයන් වෙත සපයන, සම්මුඛ පරීක්ෂණ සඳහා ලැයිස්තුගත කරන රැකියා අයදුම්කරුවන්ගේ වාර්තා සකස් කෙරෙන පරිගණක මෘදුකාංගයක් නිර්මාණය කිරීම.
2 රක්ෂණ දත්ත කළමනාකරණය සඳහා මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කිරීම.
3 කාර්යාලයට අවශ්‍ය වෙබ් පිටුව අන්තර්ජාලගත කිරීම.
4 සියලුම පරිහරණය කරන්නන් හට පරිශීලක විද්‍යුත් තැපැල් ලිපින හා මුරපද ලබා දීම.
5 ආපදා අවස්ථාවකදී නැවත පිහිටුවීමේ සැලැස්ම වැඩිදියුණු කිරීම.
6 නව දත්ත උපස්ථ ක්‍රමවේදයක් සැකසීම.
7 ගිණුම්කරණ මෘදුකාංග පැකේජය සර්වර් පරිගණකය මත දත්ත ගබඩාවන පරිදි සකසා එහි ආරක්ෂාව, කල්පැවැත්ම හා අවශ්‍ය වේලාවට භාවිත කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීම.
8 පරිගණක නවීකරණය හා කළමනාකරණය

9 සෑම පරිගණක පරිශීලකයෙකුටම නව වයිරස් ආරක්ෂණ පද්ධතියක් පරිගණක ජාලය තුල ස්ථාපිත කිරීම.
10 පරිගණක මෘදුකාංගය වැරදි අවම කරලීම හා කළමනාකරණය
11 2015 මැයි මස සිට දෙසැම්බර් කාල සීමාව තුලදී ජීව දත්ත 1233 ක් දත්ත ගබඩාවට ඇතුලත් කිරීම.




12 විවිධ ක්ෂේත්‍ර වලින් අයදුම් කරුවන් ලියාපදිංචි කර ගැනීම ඔස්සේ තොරතුරු තාක්ෂණ අංශය විසින් අයදුම්කරුවන් 793 කගේ සම්පූර්ණ කරන ලද ජීව දත්ත සති දෙකක කාලයක් තුලදී දත්ත ගබඩාවට ඇතුලත් කිරීම.

## v. විගමණික ශ්‍රමික රක්ෂණ අංශය

සමාලෝචනයකට භාජනය කරන කාලය තුළ ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි ආයතනයට ආදායම් බිහි කරන අංශයක් බවට පත් කිරීම හා මෙම කාලය තුළ පහත දැක්වෙන ප්‍රගතීන් අත්කරගෙන ඇත.

- රක්ෂණ යෝජනා ක්‍රමවලින් විශාලතම යෝජනා ක්‍රමයක් විදේශ රැකියා සේවකයන්ට අප ආයතනය හරහා ලබා දී ඇත.මෙහි ආරම්භය 2012 මාර්තු 29 දින වන අතර මේ යටතේ පෞද්ගලික හදිසි අනතුරු ආරක්ෂණය, ස්වභාවික මරණය, පූර්ණ අකර්මණ්‍යතාවය හා අර්ධ අකර්මණ්‍යතාවය, මෙරටට ආපසු එවන ලද සේවකයන්ට වෛද්‍ය යෝජනා ප්‍රතිලාභ රාජ්‍ය රක්ෂණ ආයතනය හරහා ලබාදී ඇත.තවද මෙම ප්‍රගතීන් අප සමාගම හරහා ක්‍රියාත්මක කර ඇත.

- මේ සඳහා රක්ෂණ ආවරණය, දැනට පවතින විශාලතම රක්ෂණ සමාගමේ සේවය ලබා ගන්නා අතර එම ආයතනයේ පූර්ණ කාලීන නියෝජිතයා ලෙසද අපි කටයුතු කරන්නෙමු. තවද අප මව් ආයතනයෙන් රක්ෂණ ආවරණය ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි ආයතනය වෙත ලැබුනේ 2015 මාර්තු 29 වන දින දක්වා පමණි.

- 2015.01.01 සිට 2015 මාර්තු මස 29 දින දක්වා 69,221ක් පමණ වන රක්ෂිතයන් මෙම යෝජනා ක්‍රමය යටතේ ආවරණය වී ඇති අතර 2015 ජනවාරි 01 දින සිට 2015 දෙසැම්බර් 31 වන දින තෙක් නැවත මව්බිමට පැමිණීම සම්බන්ධ හිමිකම් 2600 ඉදිරිපත්කර ඇත. අප විසින් හිමිකම් 2333 ක් කඩිනමින් නිරාකරණය කර ඇති අතර හිමිකම් 170 විසඳුම් මට්ටමේ පවතී. තවද හිමිකම් 90ක් ඔප්පු කොන්දේසීන්ට අනුව ගෙවීම් ප්‍රතික්ෂේප කර ඇති අතර ඉතිරි හිමිකම් නිරාකරණය කරමින් සිටී.මරණ හිමිකම් 192 ලැබී ඇතත් හිමිකම් 214ක් මෙම කාලසීමාව තුළ ගෙවා අවසන් කර ඇති අතර හිමිකම් 18 ක් ගෙවීම් සඳහා අනුමත වී ඇත.ඉතිරි හිමිකම් ද අදාළ අවශ්‍ය ලිපි ලේඛන ලැබීමෙන් පසු සමථයකට පත් කිරීමට කටයුතු කරන බව දන්වමි.අප වෙත ලැබී ඇති පූර්ණ ආබාධිත හිමිකම් 82 ක ප්‍රමාණයෙන් 37ක් නිරාකරණය කර ඇති අතර ඉතිරිව ඇති හිමිකම් ක්‍රියාවලි මට්ටමේ පවතී.(ඉහත සඳහන් කර ඇති ගෙවීම් කරන ලද හිමිකම් වල 2014 වර්ෂයේ අප වෙත ලැබී 2015 වර්ෂයේදී ගෙවීම් කරන ලද හිමිකම් ද අන්තර්ගතය)

- මීට අමතරව අප මව් ආයතනයේ ඇති විදේශ සම්බන්ධතා අංශය මගින් ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි ආයතනය වෙත යොමු කරන හිමිකම් සඳහාද ප්‍රතිපූර්ණයන් අප විසින් කරනු ලබයි.

## 4.4. ක්‍රියාත්මක කළයුතු අනාගත බලාපොරොත්තු හා වැඩසටහන්

### i බඳවා ගැනීමේ අංශය

බඳවාගැනීමේ අංශය මගින් නව රැකියා ඇණවුම් ලබා ගැනීම.

රැකියා අවස්ථා පිළිබඳව ලංකාව පුරාවට දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කරමින් බඳවා ගැනීම් සිදුකරමින් විදේශ ගතවීමේ ප්‍රවණතාවය වැඩි දියුණු කිරිම.

1. විදේශ රටවල් අතර රැකියා ප්‍රවර්ධන හා ජංගම වැඩසටහන් දියත් කරමින් රැකියා ඇණවුම් ප්‍රමාණය පුළුල් කිරිම හා ඒ සඳහා පුද්ගලයින් බඳවා ගැනීම.
2. යුරෝපීය රටවල් සඳහා රැකියා ප්‍රවර්ධන වැඩසටහන් දියත් කරමින් විදේශ රැකියා උත්පාදනය නඟා සිටුවීම.
3. ශ්‍රී ලංකා විදේශ රැකියා ආයතනයේ දත්ත බැංකුව පුළුල් කිරීම.
4. එතෙර සවිය ගමින් ගමට වැඩසටහන මගින් දිස්ත්‍රික්ක වශයෙන් රැකියා ප්‍රවර්ධන වැඩසටහන් දියත් කරමින් පුද්ගලයින් බඳවාගැනීම.
   I රැකියා ඇනවුම් ලැබීමට පෙර හා පසුව ඒ සඳහා පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
   II පුහුණු කිරීමේ මධ්‍යස්ථාන වෙත ක්‍රියාකාරී ශ්‍රමිකයින් යොමු කිරීම.
   IV රැකියා ප්‍රවර්ධන නිලධාරීන් පත් කිරීම හා ශ්‍රමිකයින් බඳවාගැනීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.
   V කාර්මික හා අධ්‍යාපන ආයතන සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.

වර්තමානයේ අප සමග බඳවාගැනීම් සිදුකරනු ලබන ප්‍රධන සේවායෝජකයින් කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| 01. බින් ජාසිම් ගරාජ් -සෞදි අරාබිය | බරවාහන රියදුරු,වෙල්ඩර්,පේන්ටර්,මිකැනික් |
| 02. අල් බටීල් සීකුවර් - දෝහා කටාර් | ආරක්ෂක නිලධාරීන් කාන්තා සහ පිරිමි, අධීක්ෂක ආරක්ෂක නිලධාරීන්, මුදල් අයකැමිවරු, සැහැල්ලු වාහන රියදුරු, |
| 03. සසීබ් මෝල්ඩ් - සෞදි අරාබිය | සී එන් සී මිලින්, ලේත් ඔපරේටර්, ඊ ඩී ඩබ් වයර් කට් ඔපරේටර් |
| 04. ඇන්කර් එලයිට් - ඩුබායි | ගණකාධිකාරීවරුන් , කම්කරුවන් |
| 05. සුන්දෝසියා ලීඩින් - සෞදි අරාබිය | ප්‍රමාණ සමීක්ෂණ කරුවන්, පබ්ලික් කාර් රියදුරු |
| 06. නැනෝ - සෞදි අරාබිය | කම්කරු, පබ්ලික් කාර් රියදුරු |
| 07. ඇල්කෝ - දෝහා කටාර් | බරවාහන රියදුරු, සැහැල්ලු වාහන රියදුරු, මේසන් ෂටරින් කාපෙන්ටර්,ස්ටීන් ෆික්සර්, විදුලි කාර්මික ශිල්පීන්, පයිප්ප වැද්දුම්කරුවන් |
| 08. කේ පී එම්ප්ලෝයිමන්ට් - සයිප්‍රස් | ගෘහ පාලිකා |
| 09. ප්‍රයිවෙට් එම්ප්ලෝයිමන්ට් - සයිප්‍රස් | ගෘහ පාලිකා |

## ii. මූල්‍ය අංශය

❖ ඉදිරි සැලසුම්

i. ආයෝජනය ඉහළ දැමීම
ii. වර්ෂ 2015 වාර්ෂික මූල්‍ය වාර්තා වර්ෂ 2016 පෙබරවාරි මස 15 දිනට ප්‍රථම සම්පූර්ණකර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත භාර දීම.

## iii. පරිපාලන හා මානව සම්පත් අංශය

i. ආයතනයට නිතිපතා පැමිණෙන රැකියා අපේක්ෂකයින් සඳහා නව ආසන ලබා ගැනීම.

## iv. තොරතුරු තාක්ෂණ අංශය

තොරුතුරු තාක්ෂණ අංශය මගින් පහත දැක්වෙන අරමුණු ලඟාකර ගැනීම පිණිස ඉදිරියේදී කටයුතු කරනු ඇත.

i. Office 365 පැකේජය අත්හදා බැලීම.
ii. පරිගණක සාක්ෂරතාවය ඉහළ නංවාලීම සඳහා කෙටිකාලීන වැඩමුළු පැවැත්වීම.
iii. අලුතින් හඳුන්වාදුන් මෘදුකාංගයේ භාවිත කරන්නන්ගේ පහසුව නංවාලීම.
iv. ආපදා හා හදිසි අවස්ථා සඳහා පූර්ව උපායන් ක්‍රියාත්මක කිරීම.
v. නව රැකියා සපයන්නන් පිළිබඳ අන්තර්ජාලය පරිශීලනය තුලින් තොරතුරු එක්රැස් කිරීම.
vi. අන්තර්ජාලයේ ආරක්ෂාව තහවුරු කරලීම හා නංවාලීම.
vii. මානව සම්පත් කළමනාකරණ අංශයේ වාර්තා ස්වයංක්‍රීයව ජනනය කරලීමට සැලසීම.
viii. අන්තර්ජාලය යාවත්කාලීන කිරීම.
ix. ලියාපදිංචි වන සෑම අයදුම් කරුවකුටම කෙටි පණිවුඩ මගින් ලියාපදිංචිය තහවුරු කිරීම.
x. නව ආරක්ෂණ පද්ධතියක් පරිගණක ජාලය තුල ස්ථාපිත කිරීම.

## v. විගමණික ශ්‍රමික රක්ෂණ අංශය

- විදේශ රැකියා සඳහා පිටත් වන අය සඳහා අත්‍යාවශ්‍ය සේවාවක් වන රක්ෂණ සැලසුම දේශීය රක්ෂණ සමාගමක් මගින් වඩා වේගවත් හිමිකම් සහ වැඩි ප්‍රතිලාභ රක්ෂණ ලාභියා වෙත ලබා දීම.

## 4.5.මූල්‍ය කාර්ය සාධනය

### 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාරාංශගත ආදායම් හා වියදම් ප්‍රකාශනය

| | **2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා විගණනය නොකරන ලද (වියදම් වෙන්කිරීම් ඇතුලුව)** | **2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා විගණනය කරන ලද** |
|---|---:|---:|
| ආදායම් | 52,626,162.91 | 74,136,787.15 |
| | | |
| වෙනත් ආදායම් | | |
| පොළී ආදායම් | | |
| ඉතිරි කිරීමේ ගිණුමේ පොළී | 973,684.00 | 1,241,641.06 |
| ස්ථාවර තැන්පතු පොළී | 5,668,162.30 | 12,211,774.29 |
| වාහන විකුණුම් ලාභය | - | 3,853,869.03 |
| ආපදා ණය පොළී | - | 44,728.02 |
| විදේශීය මුදල් ගිණුම් පොළී | 14,127.20 | 1,506.81 |
| මුළු ආදායම | **59,282,136.41** | **91,490,306.36** |
| | | |
| අඩුකලා වියදම් | | |
| පරිපාලන වියදම් | 47,311,971.47 | 37,927,320.41 |
| ගමන් හා ප්‍රවහන වියදම් | 2,831,876.81 | 2,618,449.52 |
| වෙනත් වියදම් | 5,768,633.72 | 4,142,470.22 |
| දළ ආදායම/වියදම | 3,369,654.41 | 46,802,066.21 |
| මූල්‍ය හා වෙනත් වියදම් | 2,349,700.18 | 5,015,542.88 |
| **ශුද්ධ ආදායම/වියදම බදු වලට පෙර** | **1,019,954.23** | **41,786,523.33** |